# බුදුසරණ


ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ දුරුතු අමාවක පෝදා 2023 ජනවාරි 21 සෙනසුරාදා BUDUSARANA SATURDAY JANUARY 21, 2023

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 31 පත්‍රය , පිටු 12 ආරම්භය 1965 - 06 - 13




කාංචනාස්කන්ධ ජාතක කතාව ඇසුරිනි



# යහපත් බව නපුරට එරෙහි පලිහකි

**නුවණැත්තා තම සුර පුර තමා ම සාදා ගන්නා අතර අනුවණ තැනැත්තා තම නිරය තෙමේ ම සාදා ගන්නේ ය.**

සුර පුර හා නිරය පිළිබඳ බෞද්ධ සංකල්පය වෙනත් ආගම්වල එම සංකල්පයට වඩා බෙහෙවින් වෙනස් ය. බෞද්ධයෝ එම ආයතන සදාතනික සේ නොසලකති. මිනිසකු නිරයට සදාතනිකව ගර්හිත කරනු ලැබීම අසාධාරණ ය. ඔහුගේ මානුෂික දුර්වලතා නැති කර ගැනීමට හා තම සංවර්ධනය ඇති කර ගැනීමට හැකි සෑම අවස්ථාවක් ම ලබා දීම යුක්ති සහගත ය. බෞද්ධ මතයට අනුව අපාගත වුව ද පූර්ව ජාතියේ කළ කුසලයන් ඇතොත් ඒවා පලදීමෙන් ඉහළට පැමිණීමට ද ඉඩ ඇත්තේ ය.

නිරයේ දොරටුවලට යතුරු දමා නැත. නිරය තාවකාලික එකකි. එහි සදාතනික තැවීමකට සත්වයාට කිසිදු හේතුවක් නොමැත. බුද්ධ දේශනාවට අනුව සුරපුර හා නිරය ඇත්තේ මෙලොව ඉක්මවා යෑමෙන් පමණක් නොවේ. මෙලොවදීමත් ලැබිය හැකි ය. ඒ අනුව සුරපුර හා නිරය පිළිබඳ බෞද්ධ සංකල්පය ඉතා සහෙතුක ය. නිදසුනක් ලෙස බුදු රදුන් වදාළ කරුණක් දැක්විය හැකි ය. එනම් කිසියම් සාමාන්‍ය අඥාන පුද්ගලයකු මහ සයුරට යට නිරය හෝ පාතාල ලෝකයක් ඇති බව තිර කෙරෙන කාරණා ගෙනහැර දක්වන්නේ නම්, ඔහුගේ ප්‍රකාශනය සාවද්‍ය ය. පදනම් විරහිත ය. නිරය හෝ අපාය යන පදයෙන් අදහස් වන්නේ පීඩාකාරී වේදනාත්මක හැඟීම් ය.

බෞද්ධ සංකල්පයට අනුව නිරය යනු දෙවියන් මවු එක්තරා බිමක් හෝ සූදානම් කළ තැනක් ලෙසින් නොපිළිගැනේ. මෙලොව ඇති නිරයේ තාපය මෙලොවින් පිටත ඇති නිරයේ තාපයට වඩා වැඩි ය. කෝපයට වැඩි ගින්නක් තිබේද? කාමය හෝ ලෝභය හා අවිද්‍යාව ද එසේම ය. බුද්ධමතයට අනුව එකොළොස් වර්ගයක භෞතික වේදනා හා මානසික පීඩනයන්ගෙන් තැවෙන්නේ ය. කාමය, ද්වේෂය, මායාව, ලෙඩ රෝග, දිරීම, මරණය, මනස්තාපය, වැලපීම (ශාරීරික මානසික) වේදනාව කනස්සල්ල හා දුක ආදිය යි. මිනිසුනට එකී මනෝ විසංගත තත්ත්වයන් සමහරක් නිසා ඇතිවන ගින්නෙන් මුළු ලොවම වුව ද දවා අළුකළ හැකි ය. බෞද්ධ දර්ශනයට අනුව සුර පුර හා නිරය ඉතා පහසුවෙන් නිර්වචනය කළ හැකි වේ. එනම් මහත් දුක් වේදනා ඇත්තේ යම් තැනෙක ද? එය මෙලොව හෝ වේවා. අන් කිසියම් තලයක වේවා, එතැන දුක් පීඩා විඳින වුනට අපායෙකි.

එමෙන්ම මහත් සුව සතුට ඇත්තේ යම් තැනෙක ද? එය මෙ ලොව හෝ වේවා, අන් කිසි තලයක හෝ හෝ වේවා එතැන ලෞකික සුව විඳින්නවුනට සුර පුරයෙකි.

ඒ කෙසේ වෙතත් මානව ජීවිතය දුක සැප දෙක ම මිශ්‍රණය වූ තැනක් සෙයින් මිනිසුන් දුක සැප දෙකම ප්‍රත්‍යක්ෂණය කරන අතර, මනුෂ්‍ය ජීවිතයේ සැබෑ ස්වභාවය අවබෝධ කර ගැනීමට සමත්විය හැකි ය. නමුත් බොහෝ වෙනස් තලයන්හි ජීවත් වීමේ දී එහි වසන්නන්ට එබඳු අවබෝධයක් ලබා ගැනීමට ඇති ඉඩකඩ ප්‍රස්ථා අඩු ය. ඇතැම් භවයන්හි සතුටට වඩා දුක් වේදනාවන් අඩු ය. තවත් තැන්වල දුක් පීඩනවලට වඩා සතුට ප්‍රීතිය ඇත්තේ ය.

බෞද්ධයන් විශ්වාස කරන්නේ මරණින් මතු පුනරුත්පත්තිය ක්‍රියාත්මක වී කිසියම් භවයක ඉපදිය හැකි බවයි. එකී අනාගත භවය තීරණය වන්නේ පුද්ගලයා මැරෙන මොහොතේ ප්‍රතිසංවේදනය කරන ප්‍රතිසන්ධි චිත්තය අනුව ය. හෙවත් මැරෙන මොහොතේ දැනෙන අවසාන නිමේෂය අනුව ය. එකී පුනරුත්පත්තිය තීරණය කරන අවසාන සිතිවිල්ල මිනිසාගේ පූර්ව ආත්මයේ හෝ මේ ජීවිතයේ දී කරනු ලැබූ ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයෙකි. මේ නිසා ප්‍රබලතම සිතිවිල්ල පරාවර්තනය වූයේ කුසල ක්‍රියාවන් අනුව නම් ඒ තැනැත්තාගේ අනාගත භවය සුවදායක තැනක් වේ. නමුත් ඒ භවය තාවකාලික ය. එය ගෙවී අවසන් වත්ම නව ජීවිතයක් පටන් ගැනීම යළි ඇරඹේ. එය ද තීරණය වන්නේ වෙනත් ප්‍රබල කර්ම බල වේගයකිනි. යමකු නිවැරැදි දැකුම ලබන තෙක් මේ අවිච්ඡේද ක්‍රියා පිළිවෙළ අවසානයක් නොමැතිව සිදු වන්නක් බැවින් අධිෂ්ඨානශීලීව අවසාන සුවය වූ නිවන උපදවන ආර්ය මාර්ගය අනුගමනය කළ යුතු ය.

සුරපුර ද තාවකාලික ය. එහි ද කුසල ක්‍රියාවන් කළ තැනැත්තනට අධික ඉන්ද්‍රිය පිනවීම් සහිත දීර්ඝ කාලයක් ප්‍රත්‍යක්ෂණය කළ හැකි ය. අපාය ද තාවකාලිකය. එහිද අකුසල් කළ තැනැත්තාට අධික කායික මානසික දුක්වේදනා ප්‍රත්‍යක්ෂණය හෙවත් ප්‍රතිසංවේදනය සිදුවෙයි. එකී ආයතනයන් ස්ථිර ඒවා ලෙස විශ්වාස කිරීම සාධාරණ නොවේ.

සුර පුර, නිරය යන දර්ශන දෙකෙහි ම පිටුපස දෙවියෙක් නොමැත. ප්‍රතිසංවේදනය සඳහා ඇත්තේ ඔහු ගේ කුසල කර්මය හෝ අකුසල කර්මයයි. බෞද්ධයෝ කිසි දිනක නිරයේ ගිනි දැල් පෙන්වා මිනිසුන් බිය පත් කර හෝ පාරාදීසය පෙන්වා මිනිසුන් කුල්මත් කර බුදු සමය ඉදිරිපත් නොකරති. ඔවුන්ගේ ප්‍රධාන අදහස බෞද්ධයාගේ චරිතය ක්‍රමානුකූලව ගොඩනැඟීමයි. මනස පුහුණු කිරීමයි.

බෞද්ධයනට තම ප්‍රගුණ කිරීමේ දී සුරපුරය ඉලක්ක කර ගැනීමක් හෝ නිරය කෙරෙහි බිය වැඩිකර ගැනුමකින් තොරව කළ හැකි ය. ඔවුන්ගේ වගකීම වන්නේ මානසික සාමය සාධාරණ ගතිගුණවලින් හෙබි සිල්වත් දිවිපෙවෙතක් ගෙන යෑම ය.

## දේව විශ්වාසය

බෞද්ධයෝ දෙවි දේවතාවුන්ගේ පැවැත්මක් නැතැයි නො කියති.

ඉඳුරන් පිනවීම අතින් බලන විට දෙවි දේවතාවෝ මිනිසුනට වඩා වාසනාවන්තයෝ ය. මිනිසුනට නැති ඇතැම් බලයක් ඔවුනට තිබේ. ඔවුහු ද තමනට ඇති බලය කෙතරම් වුවත් ඇතැම් සීමාවනට යටත් ය. තාවකාලික ය. ඔවුහු මිනිසුනට වඩා දීර්ඝ කාලයක් ජීවත්වන්නාහු ය. සැපවත් වාසස්ථාන ඇත්තෝ ය. ප්‍රීතිමත් ජීවිත ගත කරන්නෝ ය. ඔවුන්ගේ ද කුසල කර්මයන් ගෙවී යත්ම (පූර්ව භවයන්හිදී රැස්කර ගත් පරිදි) කුසලා කුසල කර්ම බල අනුව යළි පුනරුත්පත්තියක් යම් කිසි තැනෙක ලබන්නාහුය. බුද්ධ මතය අනුව මිනිසත් බව ලැබීම නිසා වඩා යහපත් තත්ත්වයන්හි ඉපදීමට කුසල් රැස් කළ හැකි ය. ඒ සඳහා දෙවියනට ඇත්තේ අවම අවස්ථා ය. බෞද්ධයන් අතර ඇති පොදු විශ්වාසයක් නම් කිසියම් කුසල කර්මයක් කළ කල්හි ඒ කුශලානිශංසයන් දෙවි දේවතාවුනට අනුමෝදන් කිරීමෙන් ඔවුන්ගෙන් පිහිටාධාර ලබා ගත හැකි බවයි. මේ මතය පදනම් වී ඇත්තේ බුදු රදුන් විසින් දෙවි දේවතාවනට ආගම ධර්මානුකූලව ජීවිත ගත කරන්නවුනට ආරක්ෂාව සැලසිය යුතු ය යන නියෝගයයි.

බෞද්ධයන් දෙවියනට පින් අනුමෝදන් කිරීමට හෝ ඔවුන් සිහි කිරීමට සෑම පුණ්‍යකර්මයකින් පසුව පුරුදු වී සිටින්නේ එම හේතුව නිසා ය. එහෙත් ඒ දෙවියනට වැඳුම් පිදුම් කිරීමට උනන්දු කිරීමක් නොකළ සේක. එහෙත් ඇතැම් බෞද්ධ සිරිත් දෙවියන් වටා සිදු කෙරෙනු පෙනේ. මිනිසුන්ට මහත් දුෂ්කරතා පැමිණි විට ඒ දුක්මුසු ප්‍රකාශනයන් ඉදිරිපත් කර අස් වැසිලි ලැබීම් වස් දේවාලයට පිවිසෙන බැව් පෙනේ. එසේ කිරීමෙන් කිසියම් සැනසිලි සුවයක් ඔවුන්ගේ හදවත් තුළ ඇති වේ. එයින් සැනසීමක් ද ලබති. එසේ වෙතත් විද්‍යාර්ථියකු, ප්‍රබල අධිෂ්ඨානයක් ඇත්තකු හොඳ අධ්‍යාපනයක් හා අවබෝධයක් ඇත්තකු එවැනි විශ්වාසයට හා පිළිවෙත්වලට නැඹුරුවීමක් ඇති නො කරනු පෙනේ.

බුදු සමයෙහි නියත වශයෙන් ම සඳහන් නැති දෙයකි නිවන් සුවය පතා දෙවි දේවතාවුන් වන්දනා කිරීම. බෞද්ධයන් විශ්වාස කරනුයේ කුසල් අකුසල් පුද්ගලයා මත පිහිටා ඇති බවත් කිසිදු බාහිරයකුට අනිකකු පවිත්‍ර කළ නොහැකි බවත් ය. (ධම්මපද)

බුද්ධත්වය හා නිර්වාණය සාක්ෂාත් කර ගැනීම බාහිර මූලාශ්‍රයක ආධාර නොමැතිව කර ගත හැක්කකි. බෞද්ධයනට තම ආගම පිළිපැදීම දෙවියන් ඇතිව හෝ නැතිව කළ හැකි ය.

## අවතාර ලෝකය

පෙනෙන නොපෙනෙන ආලෝක තිබෙන්නා සේ ම දෘෂ්‍යමාන හා අදෘෂ්‍යමාන සත්වයන් හෝ දෘෂ්ටි තිබිය හැකි ය.

යහපත් හෝ අයහපත් දෘෂ්ටි නැතැයි බුදු සමය නොකියයි. පෙනෙන හා නොපෙනෙන සත්වයන් හෝ දෘෂ්ටීන් පෙනෙන නොපෙනෙන ආලෝකයක් තිබෙන්නාක් මෙන් තිබිය හැකි ය. නො පෙනෙන ආලෝකයන් දැකීම සඳහා විශේෂ උපකරණ අවශ්‍ය වන්නා සේ නො පෙනෙන සත්වයන් දැකීම සඳහා විශේෂ සංවේදනයන් අපට අවශ්‍ය විය හැකි ය.

අපගේ මසැසට නො පෙනෙන නිසාම එවැනි ඇතැම් දිෂ්ටි නැතහොත් අවතාරයන්ගේ පැවතීමක් නැතැයි අපට කිව නො හැකි ය. මෙකී දිෂ්ටි ද ඉපදීම හා මරණයට යටත්ව ඇත්තේ ය. ඇතැම් ඒවා දිෂ්ටි රූපයෙන් සදාකාලිකව ම නොපවතිනු ඇත. ඒවා ද අප ජීවත්වන ලෝකයේ ම පවතින්නේ ය.

ඉතිරිය 03 පිටුවට ...

කේ.ශ්‍රී ධම්මානන්ද නාහිමි

02 පිටුවෙන් ...

බුදුරජාණන් වහන්සේගේ අනාවරණය පර්යාප්ති මාලාවට අනුව ජීවිතය හැඩ ගසාගත් තැනැත්තා පරම බෞද්ධයෙකි. ඔහු මේ දෙවිදේවතාවුන් හා අවතාර සඳහා කෙරෙන පුද පූජාවන් කෙරෙහි සැලකිලිමත් නො වෙයි. ඒ කෙසේ වෙතත් මෙකී පුද පූජා බොහෝ දෙනකුගේ අභිරුචියට හා ආකර්ෂණයට යොමුවීම නිසා මෙකී ක්‍රියාකාරකම්වලට බෞද්ධයන් සම්බන්ධ වීම ස්වභාවික ය.


අයහපත් දෘෂ්ටිවලින් ආරක්ෂා වීම ගැන සලකා බැලීමේ දී යහපත් භාවය නපුරට විරුද්ධ පලිහක් බඳු වෙයි. සම්‍යක් දෘෂ්ටිය පාපයන්ට කඩා වැදීමට නොහැකි පවුරක් බඳු ය. යහපත් මනුෂ්‍යයා එහි දොර විවෘත නො කළහොත් පවිටු බලවේගයන්ට එහි ඇතුළත් විය නොහැකි ය. පුද්ගලයකු සැබෑ සිල්වත් හා පවිත්‍ර ජීවිතයක් ගත කරද්දී සදාචාර සම්පන්න උතුම් ජීවනයක මනා ආවරණය ලබද්දී පවා ඒ පුද්ගලයා කිසියම් පවිටු බලයකින් තමාට හානි පැමිණිය හැකි යැයි සිතීමෙන් ඔහුගේ ආරක්ෂණ ආවරණය මඳක් පහත වැටිය හැකි ය. බුදුරජාණන් වහන්සේ කිසිදු අවස්ථාවක දී තමන් වහන්සේගේ අනුගාමිකයනට ඊනියා දෘෂ්ටීන් නොහොත් අවතාර නැමදීමට හෝ බියවීමට අවවාදානුශාසනා නොකළ සේක. ඔවුන් කෙරෙහි වූ බෞද්ධ ආකල්පය නම් ඔවුනට පුණ්‍යානුමෝදනා කිරීම හෝ පින් පැවරීම ය. ඔවුන් කෙරෙහි මෛත්‍රිය පැතිරවීම ය. බෞද්ධයෝ ඔවුනට හානි නො පමුණුවති. අනික් අතට පුද්ගලයකු ආගම මාමක නම් සිල්වත් හා මනස පිරිසුදු නම් ඔහු බුද්ධිමත් අධිෂ්ඨානශීලී අවබෝධ ශක්තියක් ඇත්තකු නම් එවැනි තැනැත්තකු ඊනියා දිෂ්ටි, අවතාර ආදියට වඩා ප්‍රබල වෙනු නියත ය. පවිටු අවතාර ඔහුගෙන් මෑත් වෙයි. යහපත් දිෂ්ටීන් ආරක්ෂාවට එනු ඇත.

## මළගිය අයට පින්දීම

ඔබට ඔබේ මියගිය අයට සැබෑ ලෙස ගරුසරු දැක්වීමටත්, උදව්වීමටත් වුවමනා නම් එවිට කළ යුත්තේ කිසියම් පුණ්‍ය ක්‍රියාවක් ඔවුන්ගේ නමින් සිදු කොට පින් අනුමෝදන් කරවීමයි. බුදු සමයට අනුව යහපත් ක්‍රියා හෝ පුණ්‍ය ක්‍රියා එම ක්‍රියා කාරකයනට මෙලොවදීත් පරලොවදීත් සැප සම්පත් ගෙන දෙයි.

පුණ්‍යක්‍රියා අවසාන නිෂ්ඨාව වූ සදාතනික සුවය කරා යොමු කරවන බව ද විශ්වාස කරති. පුණ්‍ය ක්‍රියා සිත කය වචන යන තුන් දොරින්ම කළ හැකි වේ. සෑම යහපත් ක්‍රියාවකින්ම කුසල් ඇති වෙයි. ක්‍රියා කාරකයා වෙනුවෙන් ඒ කුසල් රැස්වෙයි. බුදු සමය පවසන පරිදි රැස්කළ කුසල් අනුනට අනුමෝදන් කළ හැකි ය. එය අනුන් සමඟ ඔවුන් වෙනුවෙන් බෙදා හදාගත හැකි ය. වෙනත් වචනවලින් කියතොත් එම පින ආපසු සිහි කර තවත් අය සමඟ බෙදා ගත හැකි ය. එම පින ලබන්නා ජීවත්වන්නකු හෝ මිය ගිය අයකු විය හැකි ය. පින් අනුමෝදන් කරන්නේ ඉතා සරල ක්‍රමයකිනි. පළමුව කිසියම් කුසල් ක්‍රියාවක් කෙරෙයි. එම කුසල ක්‍රියාව කළ තැනැත්තා හුදු ප්‍රාර්ථනයක් මඟින් තමන් ලබා ගෙන ඇති පින. "අනුනට ද අත්වේවා"යි විශේෂයෙන් යමකුට හෝ නැත්නම් සියලු සත්වයන් සඳහා වේවා'යි ද, යනුවෙන් ප්‍රාර්ථනා කිරීම යි. එකී පැතුම මානසිකව ද, වාචසිකව ද ප්‍රකාශ කළ හැකි ය.

එකී පැතුම, එම පින ලාභියාගේ දැනුම ඇතුව කළ හැකි ය. ප්‍රතිලාභියා එම පින්දීම දකී නම් අන්‍යෝන්‍ය වශයෙන් පින භුක්තිවිඳීමේ ප්‍රීතියක් ඇති වේ. ප්‍රතිලාභියා ද එම ප්‍රතික්‍රියාවට එකතු වීම නිසා එයට මුලින් සහභාගි වූවකු ගේ තත්ත්වයට පත් වේ. ප්‍රතිලාභියා ද එම පුණ්‍ය ක්‍රියාව හා කරන්නා තමන් සේ හඳුනා ගැනීම කළහොත් ඔහුට ඇතැම් විට මුල් ක්‍රියාව කළ තැනැත්තාට වඩා වැඩි පිනක් අත්කර ගත හැකි ය. මක්නිසාදයත්? ඔහු එම පිනෙන් ප්‍රමෝදයට පත්වීම හෝ එම ක්‍රියාව ඇගයීම තම දහම් දැනුම මත කළ නිසා මහත්ඵල මහානිශංසදායී වෙයි. එවන් සිදුවීම් පිළිබඳ කතා පුවත් බෞද්ධ ග්‍රන්ථවල දක්නට ලැබේ.



පුණ්‍ය ක්‍රියාව කළ තැනැත්තාගේ දැනුමක් ඇතිව හෝ නැතිව ද පින් අනුමෝදන් වීමේ ප්‍රීතිය සිදුවිය හැකි ය. මෙහි දී අවශ්‍ය වන්නේ ප්‍රතිලාභියා පුණ්‍ය ක්‍රියාව දැන ගැනීම නිසා ඔහුගේ සිතෙහි පහළ වන සොම්නස් සහගත වින්දනයයි. ඔහු කැමති නම් ඔහුගේ ප්‍රීතිය සාධු නදින් ප්‍රකාශ කළ හැකි ය. එහි තේරුම යහපති, කදිමයි යනු යි.

මෙහිදී ඔහු කෙළේ එක්තරා මානසික හා වාචසික ප්‍රීති ඝෝෂාවක් මවාපාමින් අන්‍යයකු කළ කුසල කර්මයට හවුල් වීමකි. තවද මෙහි දී වැදගත් වන කරුණක් නම් එකී කුසල ක්‍රියාව යථා පරිදි අනුමත කිරීම් හා ප්‍රතිලාභියාගේ සිත්හි පැන නඟින්නා වූ ප්‍රීති ප්‍රමෝදය යි. කිසියම් පුණ්‍ය කර්මයක් කරන්නාට එහි පින අනුන්ට අනුමෝදන් කිරීමේ ආශාවක් නො මැති වුව ද අන්‍යයන් ඒ පින් අනුමෝදන් වීම ඔහුට වැළකිය හැකි නොවේ.

මක්නිසාදයත්? අනුන්ගේ සිතුවිලිවලට ඉහළින් බලපෑමේ ශක්තියක් නොමැති බැවිනි. බුද්ධ වචනයට අනුව සියලු ක්‍රියාවන්හි දී සිතිවිල්ල වඩා වැදගත් වන්නේ ය. අනුමෝදන් කිරීම ද මනෝමය හෙවත් චෛතසික ක්‍රියාවකි.

පින් අනුමෝදන් කිරීමෙන් තමන් කළ කුසල කර්මයේ පින පුද්ගලයකුට අඩුවීමක් නො වන්නේ ය. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස දක්වතොත් පුණ්‍යානුමෝදනා ක්‍රියාව ම කුසලයෙකි. ඒ අනුව මෙතෙක් කරන ලද කුසලයේ පින ද තවදුරටත් වැඩි වේ.

මිය පරලොව ගියවුනට දිය හැකි අග්‍ර තිළිණයෙකි.

යම් කිසිවකුට පිරිනැමිය හැකි මහඟු තිළිණය ලෙස බුදුරජාණන් වහන්සේ වදාරා ඇත්තේ මිය ගිය ඥාතීන් වෙනුවෙන් පින්දහම් කිරීම හා එම පින අනුමෝදන් කරවීම යි. තවද පින් අනුමෝදන් කරන්නා එමඟින් තවත් පින් රැස් කර ගන්නා බව ද උන්වහන්සේ වදාළ සේක. කුසල් කිරීමේ යෙදුණු විශේෂයෙන්ම 'මහණ බමුණන්ට දන් දීමේ යෙදුණු අයට එම කුසල් තම මිය පරලොව ගිය ඥාතීනට අනුමෝදන් කරන ලෙස බුදුරදුන් ඔවුනට උපදෙස් දී ඇත. දන්දීමේ දී මියගිය ඥාතීන් වෙනුවෙන් දන්දීමට ද, දන් දෙන විට මෙසේ සිහිපත් කරන ලෙස ද උන්වහන්සේ උනන්දු කළ සේක. එනම් ඔහු ජීවත්ව සිටිය දී ඔහු මෙවන් සම්පත් මට දී ඇත. ඔහු මේ දේ මා වෙනුවෙන් කර ඇත. ඔහු මගේ අසවල් ඥාතියා ය. මගේ හවුල් කරු ය. යනාදී වශයෙනි.

## තිරෝකුඩ්ඩ සූත්‍රය ඛුද්දකපාඨ

ඇඬීමෙන් පලක් නැත. දොම්නස් වැලපීම්, ළතෝනි දීම්වලින් මලගියවුනට කිසිදු යහපතක් නො වන්නේ ය. මළගිය ඥාතීන් වෙනුවෙන් පින් අනුමෝදන් කරවීමේ පොදු විශ්වාසය පදනම් වී ඇත්තේ කෙනකු මිය ගිය විට ඔහුගේ පින්පව් එකිනෙක ගෙන තුලනය කිරීමෙන් ඔහුගේ ඉරණම තීරණය කිරීම ගැන ය. ඔහුගේ ක්‍රියා කලාපය ඔහු යහපත් ස්ථානයක ප්‍රතිසන්ධිය ලබා ගනී ද, අයහපත් රාජධානියකට වැටේ ද යන්න තීරණය කරත්ම මිය ගිය අයගේ ආත්මය අනික් මිය ගිය අයගේ ආත්ම ඇති ලෝකයකට ගමන් කරන බව සමහර අයගේ විශ්වාසයකි.

පහත් ලෝකවල උපදින අයට අලුතෙන් පින් රැස්කර ගැනීමට නො හැකි ය. මෙලොව දී උපයා ගත් පින් මහිමයෙන් එහි ජීවත් විය යුතු ය. අනුනට හානි නො කර ජීවිත කාලය තුළ දී කුසල් රැස් කරගත් අය නිරායාසයෙන් පහසු ස්ථානයන්හි උපත ලබන්නට වාසනාව ලබති. එවැනි අයට ජීවත්ව සිටින ඥාතීන්ගේ ආධාරය අනවශ්‍ය යි. කෙසේ වෙතත් සුවදායක ස්ථානයන්හි ඉපදීමට තරම් අවස්ථා නැති අය ජීවත්ව සිටින ඥාතීන් ගේ පින් ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින්නේ තමන්ගේ ඌණතාව සපුරාගෙන සතුටුදායක වාසස්ථානයක ඉපදීමට හැකිවීම සඳහා ය.

අවාසනාවත් ආත්ම භාවයන්හි පුනරුත්පත්තිය ලැබූවන් ඔවුන්ගේ වේදනාකාරී තත්ත්වයන්ගෙන් මුදවාගත හැක්කේ තම මිතුරන් ඥාතීන් කරන්නා වූ කුසල කර්මයන්ගේ පින පවරා දීමෙන් හෙවත් අනුමෝදන් කිරීමෙනි. මිය ගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීමේ බෞද්ධ මතය පැරැණි යුග සිසාරා පැමිණි හින්දු සමයේ චාරිත්‍රයක අනුරූපයකි. මිය ගිය ඥාතීන්ගේ ආත්මයට සාමයෙන් ජීවත්වීමට විවිධ උත්සව පවත්වමින් ආධාර කරති. මේ චාරිත්‍රය ඇතැම් බෞද්ධ රටවල සමාජ ජීවිතයේ මහත් බලපෑමක් කෙරෙයි.

කිසියම් යහපත් වැඩක් කළ කල්හි මිය ගිය අය සිහි කරති. බොහෝ විට එය කරනු ලබන්නේ ඔවුන්ගේ ජීවිත හා සම්බන්ධ අවස්ථාවලදී ය. එනම් උපන් දිනය හෝ අභාවය ස්මරණය කරන සංවත්සරවල දී ය. එවැනි අවස්ථාවල සාමාන්‍යයෙන් පවත්වනු ලබන පුද පූජා ද වෙයි. පවරන්නා හෙවත් අනුමෝදකයා නම් භාජනයකින් ජලය ගෙන වෙනත් භාජනයකට වත් කරමින් පාලි ගාථාවන් කියයි. එහි අන්තර්ගත අදහස මෙසේ ය.

යම් සේ ගංගාවන් පිරී ගිය කල
වහා ගලා ගොස් මහ සමුදුරට වදී ද
එසේ ම මෙතැනින් වෑහෙන ජලය ගලායන සේ
එහි සිටින මියගියවුනට එලදායී වේවා
උස් තැනින් වැගුරූ මේ ජලය
පහළට වැගිරී යන සේ මේ දුන් පින
එහි සිටින ජීවීන්ට අත්වේවා

## නිධිකණ්ඩ සූත්‍රය - ඛුද්දක පාඨ

පින් අනුමෝදන් කිරීමේ මූලාරම්භය හා වැදගත්කම ශාස්ත්‍රීය විවාදයකට විවෘත වූවකි. මෙකී පැරැණි සිරිත අද දක්වා බොහෝ බෞද්ධ රටවල පවතින නමුදු මෙය අනුගමනය කරන බෞද්ධයන් අතුරෙන් මෙම පුණ්‍යානුමෝදනාවේ අර්ථය හා යෝග්‍ය ක්‍රියා පිළිවෙළ අවබෝධ කරගෙන ඇත්තේ ඉතා ටික දෙනෙකි. සමහරු නිකරුණේ කාලය හා ධනය මිය ගිය අය සිහි කිරීමේ උත්සව සහ පරිසාධනයන් සඳහා නාස්ති කෙරෙති. මේ පුද්ගලයෝ අධික වියදමින් භූමදානාගාර, සොහොන් කොත් තොරණ හා වෙනත් ආම්පන්න ගොඩ නැඟීමෙන් මිය ගිය වුනට සෙතක් සැලසිය නොහැකි බැව් වටහා ගෙන නොමැත. හඳුන්කූරු, සුවඳ කඩදාසි දැල්වීමෙන් පරලොව ගිය අයට ආධාර දිය හැකි ද? නැතහොත් සත්ව ඝාතනය කරමින් සතුන් බිලිපූජාවලට යොදා ගනිමින් ආහාර පානාදිය දීමෙන් මිය ගිය ඇත්තනට පිළිසරණ විය හැකි ද? තවද දුප්පතුනට දිය හැකි, මියගිය ඇත්තන් පරිහරණය කළ දෑ ගිනි දෙවියනට පුද කිරීමෙන් මිය ගිය අයට සැලසෙන සෙතක් නැත. එය නාස්ති කිරීමක් පමණකි. මිය ගිය අයට උදව් විය හැකි එකම ක්‍රමය නම් ඔවුන් සිහිකර ආගමානුකූල ක්‍රමයකට කිසියම් කුසල ක්‍රියාවක යෙදීම ය. එකී පුණ්‍ය ක්‍රියාවකට දන්දීම, පාසල් ගොඩනැගිලි ඉදිකිරීම, විහාරස්ථාන, අනාථ නිවාස, පුස්තකාල ආරෝග්‍යශාලා, දහම් පත් පොත් බෙදාදීම වැනි කටයුතු ඇතුළත් විය හැකි ය.

බුදුරදුන්ගේ අනුගාමිකයන් නැණවත් ලෙස කටයුතු කළ යුතු ය. කිසිවකු අන්ධානුකරණය නො කළ යුතු ය. වෙනත් අය මිය ගියවුන් වෙනුවෙන් යාඥා පවත්වන අතර බෞද්ධයෝ ඔවුන්ගේ මෛත්‍රී සහගත චෛතසික තරංග මිය ගිය අය වෙත පතුරුවති.

පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් එම පින් මිය පරලොව ගියවුන්ගේ ශුභ සාධනය සඳහා අනුමෝදන් කෙරෙති. මිය ගිය අයගේ නම පැවතීමටත් ඔවුනට සැබෑ අන්දමින් හරසර දැක්වීමටත් හොඳම ක්‍රමය එයයි. ඔවුන් සුවපත් වූ විට මිය ගිය ඇත්තනට ද ඔවුන්ගේ ජීවමාන ඥාති මිත්‍රාදීනට ද ඒ අයගේ ආශීර්වාදය ද අන්‍යෝන්‍ය කරණය ද සිදු විය හැකි ය.

එබැවින් ජීවතුන් අතර සිටින ඥාතීන්ගේ යුතුකම වන්නේ පින් අනුමෝදන් කරවීමෙන් හා කෙළින් ම මෛත්‍රිය පැතිරවීමෙන් තම මිය පරලොව ගිය අය සිහිපත් කිරීම ය.

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

### දුරුතු අමාවක 2023-01-21

# නිරවුල් සමාජයකට

දම්වැලක් ශක්තිමත් වන්නේ එහි පුරුක් ගැලවී නො යන සේ එකින් එක සම්බන්ධ වී ඇති විටය. වෙන් වෙන් ව ගත් කල එහි වටිනාකම, බලය, ශක්තිය, ප්‍රයෝජනය හීන ය. මිනිස් සමාජය ද දම්වැලක් මෙනි. සමඟියෙන්, සාමයෙන්, අන්‍යෝන්‍ය විශ්වාසයෙන්, අවබෝධයෙන් ඔවුනොවුන් හා සම්බන්ධ තරමට ය එහි පැවැත්ම, දියුණුව, වටිනාකම තීරණය වනුයේ.

ස්වභාව ධර්මයෙන්ම සමාජයීය සත්වයෙක් වන මිනිසාට සාමාන්‍ය ජීවිතයේ දී ඉන් බැහැර විය නොහැකි ය. යුතුකම් වගකීම් රැසකින් බැඳී සිටින ඔහුට සමාජ සම්මතයට පිටුපෑ නොහැකි ය. යම් හෙයකින් අසම්මතයක් වුයේ නම් ය, ඒ සමාජය තුළ ගැටලු, ප්‍රශ්න, දුක්ඛදෝමනස්සයන්, අහිතකර විපරිනාමයන්ගේ මූලාරම්භය නිර්මාණය වනුයේ,

සමාජයක යහපැවැත්මට, සාමය, සමඟිය, එකමුතුකම, සහජීවනය ඇති කරනු පිණිස ශ්‍රී සද්ධර්මය තුළ අධිපති ධර්ම ත්‍රිත්වයක් පැහැදිලි කර දී ඇත. අත්තාධිපති, ලෝකාධිපති හා ධම්මාධිපති යනුවෙනි.

පුද්ගල වශයෙන් හෝ සාමූහික වශයෙන් හෝ යම් ක්‍රියාවක් කරන්නට පෙර, යම් මතයක්, ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නට පෙර අධිපති ධර්මතාවන් මත පිහිටා කටයුතු කරන්නේ නම් කිසිදු විටෙක අකටයුත්තක්, අනවශ්‍ය ගැටුමක් නිර්මාණය වන්නේ නැත. ශිෂ්ට සම්පන්න යැයි කියන්නේ එවැනි සමාජයකි.

තමන්ගේ හෘද සාක්ෂියට එකඟව බුද්ධිමත්ව සිතා නිවැරැදි ම තීන්දු තීරණ ගැනීම නැණවතාගේ ස්වභාවය වන්නේ ය. එහිදී ජාතිය, ආගම, කුලය, නිලය, බලය කිසිදු ලෙසකින් හෝ බලපෑ නොහැකි ය. තමන් අකැමැති යමක් වේ නම් අනෙක් පුද්ගලයා උදෙසා එය සිදු කිරීම අත්තාධිපති ධර්මයට පටහැනි ය. යම් ක්‍රියාවක් පිළිබඳ තීන්දු තීරණ ගැනීමට පෙර තර්කානුකූලව සිතා බලා වඩාත් නිවැරැදි අවසානයකට එළඹිය යුතු ය.

මේ දේ අයහපත් ය. මේ දේ යහපත්ය යැයි ධර්මයෙහි ඉගැන්වේ. පින් - පව්, හොඳ - නරක ඉගැන්වේ. මුං වපුරා වෙනත් බෝගයක අස්වනු ලැබිය නොහැකි සේ අයහපතක් කළේ නම් අයහපත් ප්‍රතිඵලම මිස යහපත් පල ලැබිය නොහැකි ය.

ධම්මානු ධම්ම පටිපන්න පුද්ගලයා දහමට පිටුපාන්නේ නැත. ධර්මයේ සඳහන් වන්නේ ධර්මයේ හැසිරෙන පුද්ගලයා ධර්මය විසින් ම ආරක්ෂා කරන බව ය.

ලෝක සම්මතයන්ට, සමාජ පිළිගැනීම්වලට පටහැනි නොවන ලෙස කටයුතු කිරීම සෑම සමාජ සාමාජිකයකුගේ ම වගකීමයි. සමාජ සදාචාරයන් උල්ලංඝනය වන ලෙස කටයුතු කරන්නේ නම් ඒ පුද්ගලයා සමාජයට පිළිලයකි. ගැරහුම් ලබන්නෙකි.

පාපකර්මයක්, අකුසලයක් කොට කවර හේතුවක් නිසා හෝ එය සාධාරණී කරණය කරන්නට කිසිවකුට අවසර නැත. යම් හෙයකින් වංචාකාරීව වරද මඟ හැර යන්නට පුළුවන. එහෙත් ගොනු පසු පස එන රිය සක සේ පාපයේ විපාකය ඔහු லුහුබඳිනු ඇත. පවට බිය විය යුතු එහෙයිනි.

කෙනකුට තමන්ගේ ගෞරවය, කීර්තිය ගැන සිතා පවින් වැළකීමට පුළුවන. ධර්මය අනුව ධම්මචාරී පුද්ගලයකු වී දෙලොව යහපත සලසා ගැනීමට පුළුවන. සම්මතයන්ට පටහැනිවීමෙන් වන ලෝකාපවාදය ගැන සිතා පවට ලජ්ජා බිය ඇතිකර ගත හැකි ය. ලැබූ මිනිසත් බව අර්ථවත් වන්නේ එසේ නුවණැතිව, අර්ථවන්ට ජීවිතය හසුරුවන පුද්ගලයාගේ ය. සමාජ හිතකාමී පුද්ගලයකු වන්නේ ද ඔහුම ය.

# ජීවිතය නුවණින් දකිමු

**ජීවිතය පුදුමාකාරයි. විටෙක සතුටින් ගෙවී යනවා. තවත් විටෙක දුක්ඛ දෝමනස්සයන්ගෙන් වගේ ම විවිධාකාර ප්‍රශ්නවලින් පිරෙනවා.**

මේ ලෝකයේ ජීවත්වන තාක් කල් ප්‍රශ්න, දුක් කරදර අපේ ජීවන අත්දැකීම්වල අංගයන් ලෙසින් පවතිනවා. එක් අවස්ථාවක අපට ලාභ, කීර්ති, ප්‍රශංසා මෙන්ම සතුට ලැබෙනවා. එහෙත් තවත් විටෙක මීට හාත්පසින්ම විරුද්ධ දේට මුහුණපාන්නට සිදුවෙනවා. මේ ජීවිතය හරියට ම ඔරලෝසුවක "බට්ටා" වගේ. ඒ අතට යනවා. මේ අතට යනවා. එක් අවස්ථාවක දී අප ඉතා ආදරයෙන් පිළිගන්නා සැප දෙසට ජීවිතය යනවා. තවත් විටෙක අප හැම වෙරවීර්යයක් ම යොදා වළක්වා ගන්නට උත්සාහ කරන දුක පැත්තට ජීවිතය යනවා.

මේ සත්‍යය ඇති සැටියෙන් ම තේරුම් ගැනීමට උත්සාහ නොගෙන, මිනිසුන් කරන්නේ තමන්ට මුහුණපාන්නට සිදුවන ප්‍රශ්න තව තවත් වැඩි කොට විශාල කොට සැලකීම ය. මෙය හරියට කෙන්ද කන්ද කිරීමක් වැනි ය. තමන් ප්‍රිය කරන යමකු හෝ වස්තුවක් හෝ නැති වූ විට බොහෝ අය සිතන්නේ ඉන්පසු කිසි දිනෙක සතුටින් සිටින්නට හැකියාවක් නැතිවෙයි කියලයි.

යමකුගේ වුවමනා – එපාකම්, රුචි – අරුචිකම් ගැන එතරම් සැලකිල්ලක් නොදක්වන අය විසින් කරදර හිරිහැර කරනු ලැබුණු විට කෙනකු සිතන්නේ ඊට පෙර නොවූ විරූ පරිදි කෲර අන්දමින් තමන්ට සලකනු ලැබෙන බවයි. මේ ආකාරයෙන් සිතමින් දිගින් දිගට ම ඔවුන් සිතින් දුක් විඳිමින් කම්පාවට පත් වෙනවා. කම්පාවට පත්වෙමින් දුක් විඳිනවාට වඩා නරකද, "සියලු සංස්කාර ධර්මයන්ම අනිත්‍යයි. එනිසා සංස්කාර ධර්මයක් වූ මේ දුක්ඛදායක තත්ත්වයත් කිසියම් දවසක පහවී යනවා ඇතැයි කියා අවබෝධ කොටගෙන තමන්ගේ සිතට වද දෙන සිතිවිලි අමතක කිරීම.

අපට මේ ජීවිතයේ දී මුහුණ දෙන්නට සිදුවන සියලු දුක් කරදර දුක්ඛ දෝමනස්සයන්ගෙන් මිදීමට මගක් ඇති බව අප මනා කොට අවබෝධ කර ගත යුතුයි. සදාකාලික දුකකට ගොදුරු වන්නේ, එසේ වීමට ඉඩ දුන්නොත් පමණි. අපට එන දුක් කරදර කම්කටොළු ආදී සියලුම සංස්කාර ධර්මයන් ඇති වන්නේ හේතු ප්‍රත්‍යයන් මඟිනුයි. හේතු – ප්‍රත්‍යයන්ට පරිබාහිරව කිසිවක් හට ගන්නේ නෑ. මේ නිසා අපේ ප්‍රශ්නවලට ඒ වගේම දුක් කරදරවලට මූල හේතූන් සොයා ගත්විට, ඒ සියල්ල නැතිකර දැමිය හැකි බව අප විසින්ම අවබෝධ කර ගත යුතුයි.

මේ ජීවිතයට ප්‍රශ්න පැමිණි විට, එම ප්‍රශ්න ඉදිරියේ දුර්මුඛ නොවී සිහිනුවණින් කටයුතු කළ යුතුයි.

කිසිම පෘතග්ජන පුද්ගලයකුට ලෞකික අංශයට නැඹුරු වූ අයකුට ප්‍රශ්නවලින් සම්පූර්ණයෙන්ම මිදී සිටින්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. වෙනස පවතින්නේ ඒ ඒ තැනැත්තා ප්‍රශ්නවලට මුහුණ දෙන ආකාරය මතයි.

අප ඉතා අගයන, නැතිනම් ආශා කරන යමක් නැති වෙන්නට පුළුවනි. මේ ආකාරයෙන් සිදුවන පාඩුවට, හානියට පුද්ගලයන් මුහුණ දෙන ක්‍රම දෙකක් තිබෙනවා. සමහරු නැතිවුණු දේ, බිඳී ගිය දේ ගැන සිතමින්, පසුතැවිලි වෙමින් අන් අයට දොස් පවරමින් ඒ ගැනම තැවි තැවී සිටීමයි.

දෙවැනි ක්‍රමය "ගිය දේ ගියාවේ" , "නැති වූ දේ නැති වුණාවේ" තවත් ඒ ගැන සිත සිතා සිතට දුක් කරදර වෙන්න අවශ්‍ය නෑ යැයි සිතා ඒ සිද්ධිය සිතින් ඉවත්කර දැමීමයි.

ඒ වගේ ම අපට තවත් ක්‍රමයක් තිබෙනවා.

ඒ, පාඩුව සිදුවීමට, එය බිඳී විනාශ වෙන්නට වූ හේතුව සොයා බලා මින් පසුව මෙවැනි දේ සිදුවීම වළක්වා ගන්නට අපට පියවර ගත හැකියි. සිදු වූ ඒ පාඩුව මැකීමට, ඒ පාඩුවෙන් ඇතිවන වෙනත් ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගත හැකියි. මේ සිදු වූ සිදුවීම්වලින් එතරම් බරපතළ පාඩුවක්, නැතිනම් හානියක්, සිදු වී නැත්නම් එය සිතින් අමතක කොට දැමීම සඳහා සිත වෙනත් අරමුණක පිහිටු විය හැකියි. එනම් මේ සංස්කාර ධර්මයන්ගේ ස්වභාවයයි" යැයි සිත සිත හදාගත හැකියි. අපට දරාගත නොහැකි කිසියම් වූ අභාග්‍ය සම්පන්න දෙයක් සිදුවුවහොත් අප කළ යුත්තේ ලෝකයේ යථා තත්ත්වය පිළිබඳ

ලබා ඇති දැනුම ආධාර කොටගෙන එම සිදුවීමට මුහුණ දීමට ශක්තිය වඩා ගැනීමයි.

එබඳු වූ අවස්ථාවක දී සිත දුබල වන්නට ඉඩ නොදී උද්‍යෝගිමත් මානසික ආකල්පයක් ඇති කර ගැනීමට ඉටා ගත යුතුයි. යම් ලෙසකින් මෙවන් අවස්ථාවක සිත උකටලීව, දුබලව පැවතුණොත් එය අපේම වරදින් ඇති වූ මානසික ආකල්පයක් බව තේරුම් ගත යුතුයි.

දුක ඇතිවන්නේ අපේම ක්‍රියාකලාපයන් හේතුකොටගෙන බවත්, අපේම නොදැනීම හේතු කොටගෙන බවත් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙනවා. දුක නැති කළ හැකි ආකාරය ද උන්වහන්සේ දක්වා තිබෙනවා. මාර්ගය පෙන්වා ඇතත් සැපත ලැබීමට නම් අප ම ඒ සඳහා කටයුතු කළ යුතුයි.

සියලු ප්‍රශ්නවලට, දුක් කරදරවලට මුල වශයෙන් පවතින්නේ පුහුණු නොකරන ලද, දියුණු නොකරන ලද සිතයි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ විසින් උගන්වන ලද නිවැරැදි භාවනා ක්‍රම මඟින් සිතෙහි පවතින සියලු උකටලී ස්වභාවයන්, දුබල ස්වභාවයන් මුලිනුපුටා දැමිය යුතුයි. සිත වනාහී නිරන්තරයෙන් ඒ මේ අත දුවනවා. එක් අරමුණක පිහිටන්නේ නැති බව බුදුරජාණන් වහන්සේ පැහැදිලි කොට දී තිබෙනවා.

ඒ වගේ ම සංවර වූ සිත සැප ගෙන දෙන බවත්, නුවණැත්තා සිත සංවර කර ගන්නා බවත් උන්වහන්සේ දේශනා කොට වදාළා,

අප උත්සාහ ගත යුතු නිරන්තරයෙන් චංචල වන සිත සංවර කොටගෙන, මේ ජීවිතයත්, පරලොව ජීවිතයත් සාර්ථක කර ගැනීමට යි.

දීපා පෙරේරා



# සෑම පින්කමක් කුසලයක් අවසානයේම

# නිවන් සුව ප්‍රාර්ථනා කළයුතු ඇයි?

**මෙලොව ජීවත්වන සෑම පුද්ගලයකුටම තම පුද්ගල දිවිපැවැත්ම සඳහා මහෝපකාරී වන වටිනා සූත්‍ර දේශනාවක් ලෙස ධනංජානි සූත්‍රය පෙන්වා දිය හැක .**

ගෞතම බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ වාසය කරන කාලයේ දී අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහරහතන් වහන්සේ පන්සිය නමක් පමණ මහා සංඝයා වහන්සේ සමඟ දක්ෂිණා ගිරි ජනපදයේ වස් සමාදන් වූහ .දක්ශිණාගිරි විහාරය තිබුණේ රජගහනුවර සිට යොදුන් ගණනාවක් ඈතින් ය.

මේ වස් කාලය නිම වී මාසයකට පමණ පසුව එක්තරා භික්ෂූන් වහන්සේ නමක් රජගහනුවර සිට සැරියුත් මහරහතන් වහන්සේ බලන්නට පැමිණියා. සතියක් පමණ දක්ශිණාගිරි විහාරයෙහි වාසය කළ මේ භික්ෂූන් වහන්සේ දවසක් සාරිපුත්ත මහරහතන් වහන්සේ සමීපයට ගොස් "ස්වාමීනි, සාරිපුත්‍රයන් වහන්ස, මම මේ දක්ෂිණා ගිරියේ සිට යොදුන් හතළිහක් පමණ දකුණු දිගින් පිහිටි වනයක වාසය කරමි. මගේ ලොකු ආසාවක් තිබුණා බුදුරජාණන් වහන්සේ බැහැ දකින්න. මම මෙයට මාස කිහිපයකට පමණ කලින් ආරණ්‍යයෙන් පිටත් වුණා. ඉන් අනතුරුව රජගහනුවරට ආවා. අනේ මහා වාසනාවක්. මට බුදුහාමුදුරුවෝ දකින්න ලැබුණා. උන්වහන්සේ මගෙන් ආ ගිය තොරතුරු විමසුවා.

"ස්වාමීනි සාරිපුත්‍රයන් වහන්ස, මා වස්කාලය ගතකළේ වේළුවනාරාමයේ යි. පසුගිය හාර මාසය ම බුදුහාමුදුරුවෝ දැක්කා. දිනපතාම සවස් භාගයේ උන්වහන්සේගෙන් බණ අහන්න ලැබුණා. එයින් මගේ ශ්‍රද්ධාවත්, ධර්මය පිළිබඳ දැනුම හා අවබෝධයත් දියුණු වුණා. නොසිතූ ලාභයක් මට ලැබුණේ.

බුදුරජාණන් වහන්සේගේ අසූ මහා ශ්‍රාවකයන් වහන්සේගෙන් වැඩි දෙනෙක් දකින්නට ලැබුණු නමුත් සැරියුත් මහරහතන් වහන්සේ දකින්ට නොහැකි වුණා. ඒ නිසාම පැමිණුනේ ඔබ වහන්සේ බැහැ දකින්න. දවස් කිහිපයක් ඔබ වහන්සේගෙන් බණ අසා යන්ටයි පැමිණියේ."

"සැරියුත් මහරහතන් වහන්සේ සුදුසු ධර්මාව වාදයක් මේ භික්ෂූන් වහන්සේට ලබා දී එම භික්ෂූන් වහන්සේ ප්‍රමුදිත කළා. උන්වහන්සේ සතියක් පමණ ගත කොට නැවත යාමට සූදානම් වන අවස්ථාවේ රජගහනුවර පිළිබද තොරතුරු ටිකක් සැරියුත් මාහිමියන් විසින් එම භික්ෂූන් වහන්සේගෙන් විමසනු ලැබුවා. "කෙසේද ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ සුවසේ වෙසෙනවා ද" ?

එසේ ය ස්වාමීනි.

"මාගේ පැවිදි සොයුරු මුගලන් මහරහතන් වහන්සේ කෙසේද"

උන්වහන්සේ මෙවර ගිජ්ජකූටයේ වස් විසුවා. ආනන්ද මහතෙරුන් ආදී අනෙකුත් උතුමන් ගැන ද විමසුවා. "රජගහනුවර මගේ හිත මිත්‍රයෙක් සිටිනවා. ඔහුගේ නම ධනංජය බ්‍රාහ්මණයා. ඔහු කෙසේද? සුවසේ වෙසෙනවද?.

"අනේ සාරිපුත්තයන් වහන්ස, ඒ පිළිබඳ නම් අසන්න එපා. ඔබ වහන්සේගේ මිත්‍රයා පිළිබද එතරම් සුභවාදී කරුණු නම් නෑ.

"ස්වාමීනි සාරි පුත්‍රයන් වහන්ස, ඔබ වහන්සේගේ මිත්‍ර ධනඤ්ජානි බමුණා රජු සමඟ ලෙන්ගතුකම් දක්වා මහා මහජනයා මුලාකොට මහජන දේපළ ගසා කනවා . ශ්‍රද්ධාවන්ත වැදගත් පවුලකට අයත් ඔහුගේ ගුණවත් බිරිඳ මිය ගියා. දැන් ඔහු කිසිම සැදැහැත් බවක් නැති, කිසිවකුටවත් උපකාරයක් නොකරන ස්ත්‍රියක් සරණ පාවා ගෙන තිබෙනවා. ඔහොම තමයි ඔබ වහන්සේගේ මිත්‍රයා ගැන කියන්න තිබෙන්නේ. ඔහුගේ නම කියන විට කවුරුත් අකමැති යි.

"ඇවැත්නි, ඔබ වහන්සේගෙන් මගේ මිත්‍රයා ගැන දැන ගන්නට ලැබුණු දේ පුදුමයි. ඔහු ගැන රටේ පවතින රාවය හොඳ මදි. මම ළඟදීම රජගහනුවරට ගිය විට ඔහු හමුවීමට යනවා" යනුවෙන් සැරියුත් මාහිමියෝ ප්‍රකාශ කළහ.

දෙතුන් දිනකට පසු සැරියුත් තෙරුන් වහන්සේ උදෑසනම තම මිත්‍රයා වන ධනඤ්ජානි බමුණුතුමා දකින්නට පිටත් වුණා. ඒ යන අතරමඟ දී දන්නා කියන බමුණු කෙනකු හමුවුණා. බොහෝ සතුටින් සුවදුක් විචාරා ගෙදරට වැඩමවා , දවල් පිණ්ඩපාතය පූජා කළා. දන් වළඳා ස්වල්ප වේලාවකින් ඔවුන්ට ධර්මානුශාසනාවක් කළ සැරියුත් හිමියන් තම මිතුරාගේ නිවසට වැඩියා. ඒ යන වෙලාවේ ධනංජානී බ්‍රාහ්මණ තුමා පානය කිරීම පිණිස විශේෂ ආරක්ෂාවක් සහිතව වෙසෙන තම එළදෙනගෙන් කිරි දොව දොව සිටියා. තමාගේ ප්‍රයෝජනයට කිරි එළදෙනකු ඇති කිරීම ඔවුන්ගේ සිරිතක්.

සැරියුත් හාමුදුරුවන් දුටු විගසම ගේ ඇතුළට වඩමවා උන්වහන්සේට කිරි වීදුරුවක් පූජා කළා. "ධනංජානී බමුණු තුමනි, දැන් මට කිරි එපා. මම එන අතරතුර දානය වළඳලයි ආවේ"...

"නැත ස්වාමීනි, ඔබ වහන්සේ මෙය පිළිගන්නා සේක්වා"

මට මෙය එපා යනුවෙන් උන්වහන්සේ ප්‍රතික්ශේප කළහ.

"ස්වාමීනි, සාරිපුත්තයන් වහන්ස, මට ඔබ වහන්සේ, දුටු විගසම දන් ටිකක් පූජා කරන්නට ආසාවක් ඇති වුණා. පසුව මගේ හිතේ තිබෙන බොහෝ දේ කියන්නට ඕනෑ" යනුවෙන් බමුණා ප්‍රකාශ කළා.

"ධනංජානි බමුණු තුමනි කලකිරෙන්න එපා. මම දැන් අර නුග ගහ යටට ගොස් විවේකීව ඉන්නම්. ඔබ කෑම කා එතැනට එන්න. එවිට අපට ටික වෙලාවක් කතා කරන්නට පුළුවන්"

සැරියුත් තෙරුන් ඒ මහා වනස්පති ගස යටට ගොස් දිවා විහරණයෙන් ටික වෙලාවක් ගත කරද්දී බමුණු තුමා ද එතැනට පැමිණියා. දෙදෙනා අතර සාකච්ඡාවක් ඇතිවුණා.

සාරිපුත්‍රයන් වහන්ස, බොහෝ කාලෙකින් ඔබ වහන්සේ මේ දැක්කේ.. පසුගිය කාලයේ මට කරදර රාශියක් සිද්ධ වුණා. මගේ අර ගුණවත් සැදැහැවත් බිරිඳ හදිසි ආබාධයකින්,රෝගයකින් මිය ගියා. එය මට දරාගන්න බැරි පාඩුවක්. කුඩා දරුවන්ගේ ආරක්ෂාව පිණිස මම නැවත දුප්පත් බමුණු පවුලකින් කාන්තාවක් සරණ පාවා ගත්තා. ඇය බොහෝ ආඩම්බරයි. අහංකාරයි. දුප්පත් පවුලකින් තෝරාගත්තේ ආඩම්බරය අහංකාරකම අඩුවෙයි කියලයි. නමුත් එය හිස් බලාපොරොත්තුවක් වුණා." යනුවෙන් බමුණු තුමා තමන්ගේ හිතේ තිබෙන වේදනාව සැරියුත් මහරහතන් වහන්සේට ප්‍රකාශ කළා.

මගේ මිය ගිය බිරිඳ බොහෝම ගුණවත්, මගෙන් අඩුපාඩුවක් වුණත් ඒ සියල්ල අමතක කොට කටයුතු කිරීම ඇගේ සිරිතක්. කෙනෙක් යම් කිසි අමාරුවක් වී ආ විට පිහිට වෙනවා. මහජනයා අතර ඇය ගැන තිබුණේ පුදුම ලැදියාවක්, බැඳීමක්. දැන් ඉන්න බිරිඳගේ නපුරුකම් නිසා මිනිස්සු මා කෙරෙහි කලකිරීමක් තිබෙනවා. ස්වාමීනි, මේ වගේ ප්‍රශ්න රාශියක් මැදයි මා ජීවත් වන්නේ."

ධනංජානි සිටුතුමනි. මට ඔබ ගැන අගුණ රාශියක් දැන ගන්නට ලැබුණා. ඒ නිසා මාත් ඔබ හමුවීමට පැමිණියා. ඔබ නරක විදිහට රාජසන්තක දේපළත්, මහජන සන්තක දේපළත්, ගසා කන කතාවක් රටේ තිබෙනවා. ඔබ එසේ කර ඔය හැටි ධනය උපයන්නේ කුමකට ද?.

"ස්වාමීනි, සාරිපුත්‍රයන් වහන්ස, ගිහියන් වූ අපට වියහියදම් මාර්ග බොහෝමයක්. එනිසා ධනය ඉපයීමේ දී ප්‍රමාද අඩුපාඩු ඇති වීම පුදුමයක් නොවෙයි."

ස්වාමීනි, බොහෝ මවුපියන් පෝෂණය කරන්න, රැකබලා ගන්න තිබෙනවා. අඹු දරුවන් පෝෂණය කරන්න තිබෙනවා. අපගේ ගෙවල් දොරවල්, ඉඩකඩම්, කර්මාන්ත ශාලාවල වැඩකරන පිරිස බලාගන්න තිබෙනවා. අසල්වාසීන්ගේ අමාරුකම් ගැන සොයා බලන්න තිබෙනවා. මියගිය අයගේ අවමංගල්‍ය කටයුතුවලට පිහිට වෙන්න තිබෙනවා. ආගමික කටයුතු, දේව පූජා ආදිය සපුරාලන්න තිබෙනවා. රාජකාරි කටයුතු, අය බදු ගෙවීම් ආදී වැඩ තිබෙනවා. මේ සියල්ලම නොපිරිහෙලා ඉටුකරන අතර අපිත් හොඳට කන්න බොන්න ඕනෑ. සිත සතුටු වන නැටුම් ගැයුම් බඳු ඉන්ද්‍රිය පිනවන දේ නරඹන්න ඕනෑ. එහෙම නැතිව මේ ලෝකෙ ජීවත් වෙන්න බැහැ. මේ කියපු සෑම දෙයකට ම මුදල් උවමනා කරනවා. වස්තුව නැති නම් ඔය එකක්වත් ඉටු කරන්න බැහැ. මුදල් ඉපයීමේ දී ප්‍රමාද දෝෂ ඇති වන්නේ ඒ නිසයි."

ධනඤ්ජානි බමුණා ගේ මේ ප්‍රකාශය අසා සිටි සැරියුත් හිමියන් ධනඤ්ජානි බමුණු තුමාගෙන් මෙසේ ප්‍රශ්න කරන්ට පටන් ගත්තා.

"මිත්‍ර බමුණුතුමනි, මේ ටික අහන්න, ඔබ දැන් මට කීවා මව් මවුපියන් පෝෂණය කරන නිසා ධනය වුවමනා බව. හොඳයි. ඔබ අදමිටුකමෙන්, නරකින් ධනය උපයා මවුපියන්ට සලකනවා. එය හැබෑවක් ද?. ඔබ මරණ මොහොතට පත් වූ විට මරණ බිය ඇතිවෙයි. නිරපල්ලන් දැන් ඔබ නරකයට ඇද ගෙන යාමට සූදානම්. ඔබට නිරපල්ලන්, යමපල්ලන් කර්ම වේගය නිසා පෙනෙන්ට පටන් ගනියි. ඒ අවස්ථාවේ දී බමුණුතුමනි, ඔබට පුළුවන් ද යමපල්ලනේ මා අපායට ගෙන යන්න එපා.

ඉතිරිය 06 පිටුවට ...



නුගේගොඩ පඤ්ඤෙද්දය මහ පිරිවෙනෙහි ආචාර්ය,
කිරිමැටිමුල්ල ශ්‍රී වර්ධනාරාම විහාරවාසී ශාස්ත්‍රවේදී
**විල්පිට ගුණසිරි හිමි**



*05 පිටුවෙන් ...*

මම අධර්මයෙන් හම්බ කළාට වියදම් කළේ මවුපියන්ට කියා බේරෙන්නට හැකි ද?”

“නොහැකියි ස්වාමීන් වහන්ස”

“හොඳයි ධනංජානි, ඔබේ මවුපියෝ පැමිණ මේ අපේ පුතා අපට හොඳට සැලකුවා. යමපල්ලනි අපායට ගෙන යන්නට එපා. කියා බේරාගන්ට පුළුවන් ද?.

“බැහැ ස්වාමීනි.”

“හිතවත් බමුණු තුමනි, ඒ මරණාසන්න මොහොතේ දී ඔබ කියනවා මං අධර්මිෂ්ට ලෙස අසාධාරණ ලෙස ධනය හම්බ කළාට දූ දරුවන් වෙනුවෙන්, නෑදෑයින් වෙනුවෙන් අසල්වාසීන් වෙනුවෙන් වියදම් කළා. ඒ නිසා මාව නරකයට ගෙන යන්න එප, බේරෙන්න පුළුවන්ද.?

“බැහැ ස්වාමීනි”

එසේ නම් අනුන්ට උදව් කරන්ට කියා වැරැදි වැඩ කරන එක හොඳද?.”

නරකයි. සාරිපුත්ත මාහිමියන් වහන්ස. දැන් මට තේරෙනවා ස්වාමීනි, කවර කෙනකු වෙනුවෙන් වත් පව් කරන්න හොඳ නැහැ කියලා”. ධනංජනී, අපාගත වන මොහොතේ දී රජුට ඉදිරිපත් වී බේරා ගන්ට බැහැ. දැන් ඔබට කාරණය තේරුණා. මෙසේ කරුණු කියා ඔහු හොඳ මඟට යොමු කොට සැරියුත් තෙරණුවන් වහන්සේ ආපසු වේලුවනාරාමෙට වැඩම කළා.

ඉන් අවුරුදු පහළොවකට, විස්සකට පසු මහලු ධනංජානි බමුණු තුමා රෝගාතුර වුණා. මාස ගණනකට පසු අසාධ්‍ය වුණා. දැන් කිසිම බෙහෙතක් අහන්නේ නැහැ. මේ අවස්ථාවේ බමුණු තුමා තමන්ගේ තවත් ඥාතිවරයකුට කතා කරලා, දැන් මගේ අන්තිම අවස්ථාව. තව දවස් දෙකක්වත් ජීවත් වෙයි කියා හිතා ගන්න අමාරුයි. දැන් මට කරන්න තිබෙන ලොකුම උපකාරය මගේ හිතමිත්‍ර සාරිපුත්ත මහරහතන් වහන්සේ දෑස් පියවෙන්න කලින් දකින්ට සැලැස්වීමයි. වහා ගොස් මාගේ වචනයෙන් බුදුරජාණන් වහන්සේ වඳින්න. එසේම සාරිපුත්තයන් වහන්සේට මා වෙනුවෙන් වැඳ මාගේ තත්ත්වය පහදා දී උන්වහන්සේ දකින්ට මා බලවත් කැමැත්තෙන් සිටින බව දන්වා මෙහි වැඩමවාගෙන එන්න. මට දැන් කළ යුතු උපකාරය මෙයයි.

ඔහු වහා වේළුවනාරාමයට ගොස් බුදුරදුන් දැක වැඳ පුදා, නැවතත් ධනංජානි තුමා වෙනුවෙන් ද බුදු පියාණන් වහන්සේට වැඳ දැනුම් දුන්නා. ඉන්පසු සැරියුත් තෙරුන් වහන්සේ සොයා ගොස් මිතුරු ධනඤ්ජානි බමුණු තුමා තදබල ලෙස රෝගාතුරව සිටින බවත් උන්වහන්සේ දකින්නට බලවත් කැමැත්තෙන් සිටින බවත් දන්වා සිටියා. “හොඳයි මා එන්නම්” කියා සැරියුත් මහරහතන් වහන්සේ හිරු අවරට හැරෙන්ට ධනංජානි නිවසට වැඩම කළා.

ධනංජානි සිටුවරයාට හරිම අමාරුයි. එතුමාගේ දරුවන් පැමිණ උන්වහන්සේ ගේ ඇතුළට වැඩමවා අසුනක් පනවා, පියාණෙනි ඔබ නිතර නිතර සාරිපුත්ත හාමුදුරුවන් මතක් කළා. දැන් උන්වහන්සේ වැඩම කොට මෙහි වැඩ ඉන්නවා.

දරුවනි, මට විශාල සැනසිල්ලක් උන් වහන්සේ මේ ළඟ වැඩ ඉන්නවා. සතුටට පත් ධනංජානි බමුණු තුමා අමාරුවෙන් දෑස් ඇර අත්දෙක දරුවන්ගේ ආධාරයෙන් එක්කොට පපුව මත තබාගෙන වැන්දා. ඉන්පසු අමාරුවෙන් මෙසේ කියන්ට පටන් ගත්තා “ස්වාමීනි, දැන් නම් මට බොහොම අමාරුයි.

අහෝ දුකයි “සැරියුත් මාහිමියන් වහන්ස, මට නම් ඉවසන්න බැහැ. මට නම් ඉන්නට බැහැ. දුක් වැඩියි. මොන විදියකින්වත් දරාගෙන ඉන්න බෑ .හොඳ හයිකාරයෙක් උලකින් මගේ හිසට අනිනවා වගේ දැනෙනවා. හරියට හරක් මරන්නෙක් මුවහත් පිහියෙන් මස් කපන්නා සේ මගේ කුස තුළ කපනව වගේ දැනෙනවා. හොඳ ශක්තිය ඇති දෙන්නෙත් දුබලයකු අල්ලාගෙන ගින්නෙහි දමා එහාට මෙහාට අදිමින් පුළුස්සන මෙන් මගේ මුළු ඇඟම දනවා. සාරිපුත්තයන් වහන්ස, බොහොම අමාරුයි. ඔබ වහන්සේගේ පිහිට මිස වෙන පිහිටක් නැහැ. මට සුගති සැපයක් සලසා දෙනු මැනවි. ඔබවහන්සේ කැඳවා ගත්තේ මේ ටික කියන්නමයි” කියා ඔහු කීවා.

සැරියුත් මහ තෙරුන් වහන්සේ මහා ප්‍රඥාවන්ත මනෝ විද්‍යාඥයෙක් බඳු ය. එහෙයින් උන්වහන්සේ දැන ගත්තා බමුණු තුමාගේ අන්තිම අවස්ථාව බව. දැන් මෙතුමා නොකියා කියන්නේ අපා දුක් හිතට පේන ආකාරයයි. යමපල්ලන් නිරිසතුන් ධනංජානී තුමාගේ මනස වෙළාගෙන සිටින අයුරුයි. “මේ මගේ මිතුරා අපා දුකින් ගලවා ගැනීම මගේ යුතුකමක්. මගේ බුද්ධි මහිමය අනාගත ගිහි පැවිදි කාටත් තේරුම් ගැනීමට හැකි වන පරිදි ආදර්ශයක් වශයෙන් මා විසින් ඔහුගේ සිත, මනස වෙනත් අතකට යොමු කළ යුතුයි. එය මහා කුසලයක්. මීට වඩා උපකාරයක් නෑ. ඒ ශ්‍රේෂ්ඨ සැලකිල්ල මම දැන් සපුරාලිය යුතු යැයි අධිෂ්ඨාන කරගෙන සැරියුත් හාමුදුරුවෝ තමන්ගේ දේශනාව ආරම්භ කළා.

“ධනංජානි මිතුරු තුමනි, මගේ වචනයට හොඳින් ඇහුම් කන් දෙන්න” දැන් ඔබ බොහොම අමාරුවෙන් ගොත ගසමින් කීවේ, ඔබේ අමාරු තත්ත්වයයි. ධනංජානි මේ අවීචි මහා නරකය, බොහෝම දුකක්. හැබැයි ඊට වඩා තිරිසන් අපාය හොඳ බව කිව යුතුයි. මෙසේ උන්වහන්සේ අපායට වඩා ඉහළින් තිරිසන් අපාය ගැන වර්ණනා කොට මෙහෙම ඇසුවා.

“ඔබට මේ දෙකෙන් හොඳ කුමක් ද? “ස්වාමීනි, සාරිපුත්තයන් වහන්ස, අපායට වඩා තිරිසන් ලෝකය හොඳ යැයි මට සිතේ.

කොහොමද ප්‍රේත ලෝකය, නොපෙනී යා හැකි තරම් බලයක් ඇති තැනක්, තිරිසන් ලෝකයේ ඒ බලය නැති බව පේනවා.

මෙසේ තිරිසන් ලෝකයට වඩා ප්‍රේත ලෝකය පිළිබඳ සිත් අලවන දේ පවසා ඔහුගේ සිත ප්‍රේත ලෝකයට යොමු කිරීමට සැරියුත් තෙරණුවෝ සමත් වූහ. පෙර සේ ම නැවත මෙසේ ප්‍රශ්න කළ සේක. “කොහොමද හිතන්නේ මිනිස් ලෝකෙ හොඳ තැනක්. සැප සම්පත් ලබා ගත හැකි තැනක්. පින්කම් යුතුකම් ඉටු කර ගන්ට පහසු තැනක් අර ප්‍රේත ලෝකය හොඳ ද? නැත්නම් මේ කියන ලෝකය හොඳ ද?.

මගේ සිත සර්වප්‍රකාරයෙන් ම මිනිස් ලෝකයට යොමුවුණා ස්වාමීනි. මට මිනිස් ලෝක සුදුසු යැයි බමුණු තුමා ප්‍රකාශ කළා.

ජීවත් වෙලා ඉන්න කාලසීමාව තුළ සිදු කළා වූ වැරැදි දේවලට මරණින් මතු අපායගාමී වීමට ඉඩ තිබූ මොහු තමන්ගේ චිත්ත සිතිවිලි හරහා දිව්‍ය ලෝකය දක්වාම මනස යොමු කරවීමට සාරිපුත්ත මහ රහතන් වහන්සේ සමත් වූ ආකාරය ඉන් ගම්‍ය වෙනවා. බ්‍රාහ්මණ තුමනි දැන් කෙසේද?. මේ ඉහළම දිව්‍යලෝකය හොඳද? මීට වඩා අතිශයින් ම යහපත් බඹලොව හොඳ ද?. බඹලොව තත්වය මෙහෙමයි. බ්‍රාහ්මණ ලෝකයට හිත යොමු කරමින් කරුණු පැහැදිලි කළ සැරියුත් හිමියන් ,

බඹලොව යාමට නම් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන ගුණ හතර ඇති කරගන්ට ඕන. එසේ ගුණ ඇති කර ගන්නේ මෙහෙමයි කියමින් කරුණු පැහැදිලි කළා.

දැන් බමුණු තුමාට අන්තිමයි. සතර බඹ විහරණයට සිත යොමුකොට, සමාධිගත කොට සැරියුත් තෙරණුවෝ නිහඬව පිටත් වුණා.

“කිසිම කෙනෙක් කලබල කරන්න එපා. ශබ්ද කරන්න එපා. හඬා වැළපෙන්න එපා. එතුමාගේ අවසන් ගමන ඔය පිහිටන ලද සිතින් යාමට ඉඩ දෙන්න,” කියා දරුවන්ට උපදෙස් දී සැරියුත් මාහිමියන් එම නිවසෙන් පිටත්ව ගියා.

අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ සෑම සවස් කාලයක ම ධර්ම දේශනා කරන අවස්ථාවේ ජනී ජනයා අතිවිශාල පිරිසක් බණ අහන්ට රැස්වෙනවා. ගෞතම බුදුරජාණන් වහන්සේ රැස්ව සිටි පිරිසගෙන් මෙසේ ඇසුවා. අර ඈත වඩින්නේ කවුරුන්ද?. සියල්ලෝ ම ඒ පැත්ත බැලුවා.

ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, ඒ වඩින්නේ අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහ රහතන් වහන්සේයි. ඒ මාගේ පුත්‍රයා එසේ මෙසේ හපන්කමක් ඉටුකරලා කියලද හිතන්නේ. අතිවිශාල ක්‍රියාවක්. මාගේ ශ්‍රාවකයකු විසින් කළ හැකි ඉහළම වැඩක් සිදුකර ඔය එන ගමනක්. අපාගත වීමට සිටිය ධනඤ්ජානි බමුණු තුමා බඹලොව ඉපදීමට ලස්වා මාගේ පුත්‍රයා පැමිණෙනවා. සියල්ලෝ ම සාධුකාර දුන්නා.

බුදුරජාණන් වහන්සේ මෙසේ ප්‍රශ්න කළා.

“සාරිපුත්ත , ඔබ කොහි සිටද එන්නේ? “බුදුරජාණන් වහන්ස, ධනංජානි බමුණු තුමාගේ නිවසේ සිට එන්නේ.”

ඔබ එහේ ගියේ ඇයි ? “ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස, ඔහුට අන්තිමයි. බලන්නට කැඳවීමක් තිබුණා. මා යන විට ඔහු අපා බියෙන් හඬනවා. මම ඔහුගේ සිත නොදැනුවත් ම පිළිවෙලින් ලෝකයෙන් ලෝකයටම හෙමින් බඹලොව දක්වා යොමු කලා. “හොඳයි සාරිපුත්ත මොකද වුනේ?. බුදුරජාණන් වහන්ස, මම පැමිණියා මිස සමවතට සිත යොමු කරවා ඔහුට සිදුවුනේ කුමක් දැයි බැලුවේ නැහැ.”සුලු මොහොතකට කලින් ඔබ එන අතරතුර ඔහු මියගොස් බ්‍රහ්මලෝක උප්පත්තිය ලැබුවා.

ඔබ චතුරාර්ය සත්‍යය පිළිබඳ තවත් කරුණු ටිකක් මතක් කලා නම් ඔහු බඹ ලොව උපදින්නේ සෝවාන් ඵලයට පත් ආර්ය ශ්‍රාවකයකු වශයෙනුයි.

“මහණෙනි, ලෝකයේ බුදුවරු පහළ වන්නේ මිනිසුන් දෙව්ලොව යැවීමටවත්, බඹලෝ යැවීමටවත් නොවේ. සත්වයා මේ දුකින් එතෙර කරවීමටයි. අමාමහනිවන් දක්වාම යොමු කර වීමටයි. මහණෙනි, බණ පද හතරක් දේශනා කර අවසාන බණ පදයකින් හෝ පුද්ගලයාගේ සිත නිවනට යොමු කළ යුතු යැයි එදා බුදුරජාණන් වහන්සේ විස්තර සහිතව දේශනා කළා. මෙසේ කරුණු බුදුරජාණන් වහන්සේ දේශනා කරද්දි සැරියුත් තෙරණුවෝ බඹ ලොවට වැඩම කොට තමන්ගේ මිත්‍ර ධනංජානී බ්‍රාහ්මණයාට බණ කියා සෝවාන් ඵලයට පත් කළා.

එදා පටන් කවර තැනක බණ ටිකක් වදාරන අවස්ථාවේ දී වුණත්, කෙබඳු ආකාරයෙන් පිනක් කරන අවස්ථාවක දී වුණත් අවසානයේ දී නිවනට ම සිත යොමු කොට අවසන් කිරීම සිරිතකි. මේ කුසලයෙන් අපට නිවන් සැප ලැබේවා'යි ප්‍රාර්ථනා කරන්නේ මෙන්න මේ දේශනාවෙන් පසුව ය.

ඒනිසා ධනංජානි සූත්‍රය වැදගත් සූත්‍රයක් , එදා උසස් තනතුරු දැරූ ඇතැම් අය ධනය ඉපයූ ආකාරයත් මෙයින් පැවසෙනවා. එසේම මහජන අප්‍රසාදය පැතිරී යන සැටිත්, යහපත් බිරිඳක් ගැනත්, එබඳු ගුණවත් කාන්තාවක් පිළිබඳ ලැබෙන යහපත් ප්‍රතිඵල මෙයින් පැහැදිලි වෙනවා.

නරක ස්ත්‍රියක භාර්යාවක වුවහොත් අගුණ රටේ පැතිරී යන සැටිත් මේ සූත්‍රයෙන් දැක්වෙනවා. ඒ සියල්ලට ම වඩා කෙනකුගේ මරණ මොහොතේ දී පහළ වන තත්වය ගැන ද ධනංජානි බමුණු තුමා අන්තිම මොහොතේ ගොත ගසා කියන ලද කරුණුවලින් පෙනෙනවා.

බුදුරජාණන් වහන්සේ වදාළ කාරණය අපි කවදාවත් අමතක කළ යුතු නෑ. බුදුවරු ලොව පහළ වන්නේ මනුෂ්‍යයන් දෙව්ලොව යැවීමට නොව බඹලොව යැවීමට නොව නිවන් දැක්වීමට බව උන්වහන්සේ දේශනා කළා. බුදුවරුන් පහළ නොවුණත් හොඳ ක්‍රියාවන් කළොත් සත්වයෝ දෙව්ලොව උපදිනවා. වෙනත් ආගම් දෘෂ්ටිය අනුව පිළිපැද බඹලොව යනවා. එහෙත් නිවන් මඟ පෙන්වීමට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වීම විය යුතුයි. එනිසා අපගේ සෑම කුසලයක අවසානයේ පැතුම නිවන විය යුතු වේ.



# නිරෝගි සුව සැප සතුට දෙන අභය දානය

**පුරාණ ලංකාද්වීපයේ ජීවත් වුණා පුංචි පවුලක්. මේ පවුලේ හිටියේ මවුපිය දෙපළත්, ඔවුන්ගේ දරුවන් දෙදෙනාත් පමණයි. වැඩිහිටි සහෝදරයා තරුණ වයසට පත් වූ කෙනෙක්. බාල සහෝදරයාට නම් එතරම් වයසක් නෑ. දෙමාපියන් ඔහුට කතා කළේ 'චක්කන'කියලා. හතර දෙනාම සමගියෙන් සහ සතුටින් ජීවත් වුණා.**

හැමෝගේම අවාසනාවට අකාලයේ ඔවුන්ගේ පියා ඔවුන්ට අහිමි වෙනවා. පවුලේ ජීවන බර ගෙනියන්න වුණේ වැඩිමහලු පුතාට. ඔහු තමන්ගේ මවගේ සහ බාල සහෝදරයාගේ සහාය ඇති ව පියතුමා කර ගෙන ආ කුඹුරු වැඩ වීර්යයෙන් කරන්න පටන් ගත්තා.

ඔවුන්ගේ අවාසනාවට හිටි හැටියේ ම මවත් දැඩි සේ අසනීප වුණා. දන්නා බෙහෙත් කළත් සුවයක් නම් ලැබුණේ නෑ. වෙදරාළ හමු වී මවගේ රෝගී තත්ත්වය ප්‍රකාශ කළා. ඔවුන් විවිධ කසාය වර්ග හා කල්ක වර්ග නියම කළා. ඒවාගෙන් ද සුවයක් ලැබුණේ නෑ. පුතුන් දෙදෙනාට ම බොහොම වේදනයි මව සුවපත්කර ගැනීමට නො හැකිවීම ගැන.

තමන්ගේ නෑදෑයින්ටත්, යහළුවන්ටත්, අසල්වැසියන්ටත් මතක් කළා හොඳ වෙද මහතෙක් හමුවුණොත් ඒ බව දන්වන ලෙසට. දිනක් අසල්වැසියකුට තමන්ගේ යහළුවකුගෙන් අසන්නට ලැබෙනවා හැම රෝගයකට ම පාහේ බෙහෙත් කරන දක්ෂ වෙද මහතෙක් ගැන. ඔහු මේ පුතුන් දෙදෙනාගේ නිවසට පැමිණ ඒ බව දන්වා සිටිනවා. ලොකු පුතා ඔහුගෙන් මඟ තොරතුරු අසාගෙන වෙදමහතා හමුවීමට ගොස් සියලු ම තොරතුරු කියා නිවසට කැඳවාගෙන ඒමට සමත් වෙනවා. වෙද මහතා රෝගියා පරීක්ෂා කළා. මෙතෙක් සිදු කළ බෙහෙත් ආදියත් හොඳින් අධ්‍යයනය කළා. අනතුරුව වැඩිමහලු පුතා අමතා

'පුතේ, අම්මා සුවපත් කරන්න පුළුවන්. තවදුරටත් කාලය ගත නො කර හැකි ඉක්මණින් ම මම කියන බෙහෙත් ද්‍රව්‍ය ටික සපයා දෙන්න. ප්‍රමාද වුණොත් ජීවිතය ගැන අවධානමක් ගන්න වෙනවා'යි කියා සිටියා.

එම අවස්ථාවේ දී පුතණුවන් වෙදමහතා අමතා

'ඔබ, කියන ඕනෑම බෙහෙතක් අපගේ මව වෙනුවෙන් සොයා ගෙනවිත් දෙනවා. අවශ්‍ය දේ කියන්න'යි කියා සිටිනවා. එය අසා සිටි වෙදරාළ අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය දක්වා අවසානයේ

'පුතේ, කැලෑවෙන් හොයා ගන්න ඕන බෙහෙත් ටික තමයි ඔය සඳහන් කළේ. ඊට අමතරව තවත් බෙහෙතක් සකස් කර ගන්න අලුත් හා මස් ටිකකුත් ඕන වෙනවා. ඒවත් හොයාගෙන එන්න'යි අවශ්‍ය බෙහෙත් වට්ටෝරුව පවසා සිටියා.

මවගේ ජීවිතය බේරා ගන්න තවත් කාලය ගත කරන්න බෑ. මට පමණක් මේ සියල්ල කරන්න අමාරුයි. මම බෙහෙත්වලින් වැඩි කොටසක් හොයාගෙන එනවා. හා මස් ටික හොයා ගන්න ලෙහෙසියි. අපේ කුඹුරේ ළපටි ගොයම් පැළ කන්න මේ දවස් ටිකේම හාවෝ ආවා. ඒ නිසා පුංචි හාවෙක් හරි අල්ලා ගන්න බැරිවෙන එකක් නෑ. ඒ කටයුත්තට චක්කන මල්ලීව පිටත් කර හරිනවා'යි කල්පනා කර තම බාල සහෝදරයා අමතා

'මලනුවනි, වෙදමහතා අපගේ මව සුවපත් කරන්න බෙහෙත් වට්ටෝරුවක් ම දුන්නා.ඒවාගෙන් වැඩි කොටසක් මම හොයාගෙන එන්නම්. ඔබට කරන්න වැඩක් තියනවා. වහාම අපගේ කුඹුරට ගිහින් ළපටි ගොයම් පැළ කන්න එන හාවෙක් අල්ලාගෙන වහාම එන්න. හා මස් අවශ්‍යයි මේ බෙහෙත හදන්න'යි පවසා තම බාල සහෝදරයා ඒ සඳහා පිටත් කර හැරියා.

වැඩිමහලු සහෝදරයා සෙසු බෙහෙත් සොයාගෙන එන්න පිටත් වුණා. ඔහු අවශ්‍ය බෙහෙත් නොපමාව සොයාගෙන නිවසට පැමිණියා. එහෙත් තමන්ගේ මල්ලී බොහෝ වේලා යනතෙක් ම පැමිණියේ නෑ. මවගේ රෝගී තත්ත්වය තව තවත් උත්සන්න වී තිබුණා. ජීවිතයේ අවසන් මොහොත ගත කරමිනුයි සිටියේ. බාල සහෝදරයා තමන්ගේ මවගේ ජීවිතය රැක ගැනීමේ බලාපොරොත්තුවෙන් පැවරූ කටයුත්ත බාරගෙන කුඹුරට ගිහින් හාවෝ එන මාර්ගය දිහා බලමින් බොහෝ වේලාවක් ගත කළා. එහෙත් එක් හාවෙක්වත් පැමිණියේ නෑ. නිවසට යාමට තීරණය කරගෙන තවත් සුළු මොහොතක් බලනවායි සිතා මාර්ගය දෙසත් කුඹුර දෙසත් බලමින් සිටින ඔහුට දකින්න ලැබුණා එක් හාවෙක් ඇවිත් ළපටි ගොයම් පැළ කනවා. වටපිට බලමින් ගොයම් පැළ කන ඌට දකින්න ලැබුණා චක්කනව. බොහෝ සෙයින් කලබලයට පත් වී හාවා දුවන්න පටන් ගත්තා. චක්කනත් ඌ පසුපස එළවන්න පටන් ගත්තා. එහෙත් හාවාගේ වේගය ඉතා තියුණු නිසා මද දුරක් යන විට ම නො පෙනී ගියා. මව සුවපත් කර ගැනීමට අවශ්‍ය හා මස් නොමැතිව ගෙදර යා නොහැකි බව සිතමින් බොහොම කනගාටුවට පත් වුණා. 'දැන් කරන්න දෙයක් නෑ. ගෙදර යන්න ඕන'යි හිතලා ගෙදර එන්න පටන් ගත්තා. මද දුරක් එන විට ඔහුට ඇහෙන්න පටන් ගත්තා 'කිරි කිරි' යන හඬින් හඬන හාවාගේ ශබ්දය. ඔහු වහාම ඒ ශබ්දය ඇහෙන දිහාවට දුවන්න පටන් ගත්තා. ඒ මොහොතේ දකින්න ලැබුණා හාවා මන්දක පැටලී සිටිනවා. වහාම ක්‍රියාත්මක වෙලා මන්දෙන් මුදවා අල්ලා ගත්තා. 'මූ මරා මස් ගෙන ගොස් මගේ මව සුවපත් කරනවා'යි කල්පනා කළා. එහෙත් මොහොතක් ගත වන විට ම ඔහුට මෙහෙමත් කල්පනා වුණා.

'මගේ මවගේ ජීවිතය බේරා ගන්න තව කෙනකුගේ ජීවිතයක් පැහැර ගැනීම මට ගැළපෙන්නේ නෑ. මම උපන් තැන් පටන්, මගේ මතකයේ හැටියට අද දක්වා දැන දැන සතකුගේ ජීවිතයක් නැති කළේ නෑ. අම්මාගේ ජීවිතය බේරා ගැනීමටයි අකැමැත්තෙන් හරි මේ කටයුත්ත බාර ගත්තේ. මම මෙතෙක් පුරමින් ආ ඒ උතුම් ක්‍රියාව මේ සතාගේ ජීවිතය නැති කළායින් පසු සිඳී යනවා. ඒ දේ මට කරන්න බෑ'යි කල්පනා කර සතා මුදා හරින්න තීරණය කළා. හාවාගේ හිසත්, ඇගත් හොඳින් පිරිමදිමින් ආදර වදනින් 'මිතුර, මම ඔබට කරදරයක් කරන්නේ නෑ. ඔබගේ ජීවිතය මම ආරක්ෂා කරනවා. ඔබ නිදහසේ මිදී යන්න. වනයේ සිටින නෑදෑයින් හා යහළුවන් සමඟ සතුටින් ජීවත් වෙන්න. ඔබ කැමැති දෑ කමින්, පිරිසුදු පැන් බොමින් සුව සේ සතුටින් ජීවත් වෙන්න'යි පවසා හාවා නිදහස් කළා. චක්කන ඉතා සතුටින් නිවසට පැමිණියා. වැඩිමහලු සහෝදරයාත්, වෙදරාලත්, අසල්වැසියනුත්, ඥාතීනුත් ඔහුගේ පැමිණීම අපේක්ෂාවෙන් බොහෝ වේලාවක් බලා සිටිමිනුයි සිටියේ.ඔහු නිවසට ගොඩවුණු වහාම වැඩිමහලු සහෝදරයා 'මලනුවනි, හාවකු ලැබුණිද?'යි විමසා සිටියා. එවිට චක්කන 'ඔව් අය්යේ, ලැබුණා'යි පවසා සිදු වූ සියල්ල දන්වා සිටියා. එයින් කෝපයට පත් ඔහු චක්කනට දොස් පවරන්න පටන් ගත්තා. චක්කන බොහොම කනගාටුවටත්, සිත්තැවුලටත් පත් වුණා. මවගේ ජීවිතයේ අවසන් හුස්ම ටික ගත කරමිනුයි සිටියේ. චක්කන හැඬූ කඳුළින් මවගේ ඇඳ සමීපයට ගියා. මවගේ දෑත් අල්ලා ගත්තා. අනතුරුව හිස පිරිමදිමින් මෙහෙම කියන්න පටන් ගත්තා.


'අම්මේ, මම උපන් තැන් පටන්, මට දැනුම් තේරුම් ඇති කාලයේ පටන් අද දක්වා දැන දැන කිසිම සතකුගේ ජීවිතයන් නසා නෑ. මම හැම සතකුටම ආදරයෙන්, කරුණාවෙන් සැලකුවා. ඒ සියල්ල සත්‍ය නම් මගේ අම්මා සුවපත් වේවා'යි පළමුවත් දෙවනුවත් තෙවනුවත් සත්‍යක්‍රියා කළා. සත්‍යක්‍රියාව අවසන් වෙනවාත් සමග මව සුවපත් භාවය ලැබුවා. ඇඳෙන් නැඟී සිටියා යි රසවත් කථා පුවතක් මජ්ඣිම නිකාය අටුවාගේ සම්මා දිට්ඨි සූත්‍රයේ සඳහන් වෙනවා.

මවගේ හෝ පියාගේ හෝ සමීපතමයකුගේ හෝ ජීවිතය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් තබා තමන්ගේ ජීවිතය රැක ගැනීම වෙනුවෙන්වත් ප්‍රාණඝාතය නො කළ යුතු බවත්, එම ශික්ෂාපදය ආරක්ෂා කළහොත් එහි විපාක ලෙස සතුටින් දිවි ගෙවීමට අවස්ථාව උදාවෙන බවත්, නීරෝගී සුව ලැබෙන බවත් මේ කතා පුවත පෙන්වා දෙනවා.

කුමන අවශ්‍යතාවක් උදාවුණත් තමන්ගේ ජීවිතය රැක ගැනීමට හෝ අන් අයගේ ජීවිතය රැක ගැනීමට හෝ සැප සම්පත් ලැබීම වෙනුවෙන් හෝ තවත් කෙනකුගේ ජීවිතයක් නො නැසිය යුතු යි. මනුෂ්‍යයා ප්‍රමුඛ කොට ගත් සියලු සතුන් වෙත මෛත්‍රිය හා කරුණාව දැක්විය යුතුයි. එවැනි පුද්ගලයින්ට මෙලොවත් පරලොවත් සතුටින් ජීවත් වීමට භාග්‍ය උදාවෙනවා'යි මේ කතා පුවත අපට උපදෙස් දෙනවා.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**



# දිව්‍ය සැප ලබන්නට දෙවිවරු කළ පින්කම්

**ත්‍රිපිටකයෙහි දේවතා ශබ්දය බොහෝ තැන යෙදී ඇත්තේ දිව්‍ය ස්ත්‍රිය, දිව්‍ය පුරුෂයා යන භේදයක් සැලකීමෙන් නොවේ. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම පොදු වචනයක් වශයෙනි. දෙවියෝ ත්‍රිවිධාකාර ය.**

සම්මුති දේව – රජවරු, උත්පත්ති දේව – සදෙව්ලොව දෙවිවරු, විසුද්ධි දේව – බුදු, පසේබුදු, මහරහත් යනුවෙනි

බුද්ධ දේශනාවට අනුව 'දේව' යන ව්‍යවහාරයෙන් මූලිකව ම හඳුන්වන්නේ සදෙව් ලෝකවල ඉපිද දිව්‍යමය යස ඉසුරු වින්දනය කරන උසස් ජීවී කොට්ඨාශයක් පිළිබඳව ය. ප්‍රධාන වශයෙන් මෙසේ දෙවිවරු උපදින දිව්‍ය ලෝක හයක් පිළිබඳ ධර්මයෙහි සඳහන් වේ. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වූ දම්සක් පැවතුම් සූත්‍රයේ දී 'භූමාටු දෙවියෝ' විසින් භාග්‍යවතුන් වහන්සේ ධම්මචක්කප්පවත්තන දේශනාව පැවැත්වී යැයි ප්‍රීති ඝෝෂා කළහ" යැයි සඳහන් වේ.

භූමාටු දෙවියන් යනු මනුෂ්‍ය භූමිය ඇසුරු කරගෙන ගස්, ගල්, පර්වත, ගිරි ගුහා, ලෙන් ආදිය ඇසුරු කොටගෙන ජීවත්වන දේව කොටසකි. සමහර දෙවිවරු ගසේ මුල් වල සුවඳ ආඝ්‍රාණය කරමින් ද, කඳෙහි සුවඳ ආඝ්‍රාණය කරමින් ද, අරටුවේ සුවඳ ආඝ්‍රාණය කරමින් ද, කොළවල සුවඳ ආඝ්‍රාණය කරමින් ද, මල්වල සුවඳ ආඝ්‍රාණය කරමින් ද, ගෙඩිවල සුවඳ ආඝ්‍රාණය කරමින් ද, එම ආඝ්‍රාණයන් ආහාර කොට ගනිමින් ජීවත් වෙති. මෙසේ විවිධාකාර වූ භූමාටු දෙවියෝ සිටිති.

එසේම ආකාශයේ දිව්‍ය විමාන තනාගෙන ජීවත්වන දෙවිවරු ද වෙති. එම දෙවිවරු භූමාටු දෙවියන්ට වඩා උසස් වෙති. ඔවුන්ගේ කුසල බලය හේතුකොට ගෙන ඊට ගැළපෙන සේ විවිධ තලවල ඕපපාතිකව ප්‍රතිසන්ධිය ලබති. මෙම දෙවිවරු දිව්‍ය ඓශ්වර්යයෙන්, දිව්‍ය තේජසින්, දිව්‍ය කීර්තියෙන් බබළන අය වෙති. ඒ අනුව

චාතුම් මහා රාජික දිව්‍ය ලෝකය, තාවතිංස දිව්‍ය ලෝකය, යාමය දිව්‍ය ලෝකය, තුසිත දිව්‍ය ලෝකය, නිම්මාණරතී දිව්‍ය ලෝකය, පරනිම්මිත වසවර්ති දිව්‍ය ලෝකය යනුවෙන් දිව්‍ය ලෝක හයක් තිබේ. මේවාට සදිව්‍ය ලෝක යැයි ද කියති. එම දිව්‍ය ලෝකවල උපත ලබන දෙවිවරුන්ට අධිපතිකම් කරන පාලක දෙවිවරු ද වෙති. ඒ අනුව

චාතුම් මහාරාජික දෙව්ලොවට අධිපති වන්නේ සතරවරම් දෙවිවරු ය. ධ්‍රථරාෂ්ඨ, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ නමින් එම දෙවිවරු හඳුන්වති.

තාවතිංසයත්, චාතුම් මහාරාජික දෙව්ලොවත් යන දෙදෙව් ලොවට අධිපති වන්නේ සක්දෙව් මහ රජු ය.

යාම දෙව්ලොවට අධිපති දෙවිඳුන් සුයාම දෙවිඳුන් වේ.

තුසිත දෙව්ලොවට අධිපති දෙවියන් වන්නේ සංතුසිත නම් දෙව් මහ රජු ය

නිම්මාණරතී දෙව්ලොව පාලක දෙවියන් සුනිම්මිත දෙව් මහ රජු ය

පරනිම්මිත වසවර්තී දෙව්ලොවට අධිපති වනුයේ වසවර්තී දෙව් මහ රජු ය

මේවාට අමතරව බ්‍රහ්මකායික දෙවිවරු උපදින භූමීන් ද තිබේ.

බ්‍රහ්ම පාරිසජ්ජ වාසී බ්‍රහ්මයෝ, බ්‍රහ්ම පුරෝහිත වාසී බ්‍රහ්මයෝ, මහා බ්‍රහ්මවාසී බ්‍රහ්මයෝ, පරිත්තාභ වාසී බ්‍රහ්මයෝ, අප්පමාණාභ වාසී බ්‍රහ්මයෝ, ආභස්සර වාසී බ්‍රහ්මයෝ, පරිත්තසුභ වාසි බ්‍රහ්මයෝ, අප්පමාණ සුභ වාසී බ්‍රහ්මයෝ, සුභකිණ්හ වාසි බ්‍රහ්මයෝ, වේහප්ඵල වාසී බ්‍රහ්මයෝ, අවිහ වාසී බ්‍රහ්මයෝ, අතප්ප වාසි බ්‍රහ්මයෝ, සුදස්ස වාසී බ්‍රහ්මයෝ, සුදස්සී වාසි බ්‍රහ්මයෝ, අකනිට්ඨිකා වාසී බ්‍රහ්මයෝ යනුවෙනි.

මෙසේ දිව්‍යමය ශරීර ඇති උසස් උත්පත්තිය ලබන භූමීන් පිළිබඳ බොහෝ සූත්‍ර දේශනා තුළ තොරතුරු හමුවන අතර, එම දේවතා ප්‍රමාණය සංඛ්‍යාවකින් දැක්විය නොහැකි තරම් වේ.

ධම්මචක්කප්පවත්තන සූත්‍රය, මහා සමය සූත්‍රය, ධජග්ග සූත්‍රය ආදී සූත්‍ර මෙන් ම සංයුත්ත නිකායේ සගාථ වර්ගයට අයත් දේවතා සංයුත්තයෙහි එන සූත්‍ර අසූ එකත් දේවපුත්ත සංයුත්තයෙහි එන සූත්‍ර තිහත්, මාර සංයුත්තයෙහි එන සූත්‍ර විසිපහත්, බ්‍රහ්ම සංයුත්තයේ එන සූත්‍ර පහළොවත්, සක්ක සංයුත්තයේ එන සූත්‍ර විසිපහත්, දීඝ නිකායට අයත් සක්කපඤ්හ සූත්‍ර දේශනාව වැනි බොහෝ සූත්‍ර දේශනා තුළ දෙවියන් පිළිබඳ තොරතුරු දැකිය හැක.

බුදුරජාණන් වහන්සේගේ දෛනික චර්යාවෙහි, රාත්‍රී කාලයේ මධ්‍යම යාමයෙහි දස දහසක් සක්වල වසන දෙවියන් අවුත් බුදුරජාණන් වහන්සේ වන්දනා කොට ප්‍රශ්න විචාළ අයුරුත්, පිළිතුරු දේශනාවෙන් සතුටු වූ දෙවියන් සතුටු සිතින් බැහැරව ගිය අයුරුත් දැක්වේ. ඛුද්දක නිකායේ විමානවත්ථු පාළියෙහි සඳහන් වන විමානවාසී දෙවිවරු සම්බන්ධ සූත්‍ර අසූපහ තුළම (85) ඒ ඒ දෙවියන් කරන ලද පින්කම් සහ එහි විපාක ලැබීම් විස්තර කර තිබේ.

මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ, ලක්ඛන මහරහතන් වහන්සේ හමු වූ දෙවියන් පිළිබඳ තොරතුරු ද හමු වේ. මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා, අනාථපිණ්ඩික දේව පුත්‍රයා, ජනවසභ දේව පුත්‍රයා මෙන්ම විශ්වකර්ම දේව පුත්‍රයා ද මාර්ගඵලලාභී දෙවිවරු වූහ.

සතර වරම් දෙවිවරු බුදුරදුන් හමු වී ආටානාටිය සූත්‍ර දේශනාව සිදු කිරීමට ආරාධනා කළ ආකාරයෙන් ද දිව්‍ය ලෝකවල දෙව් දේවතාවන්ගේ ස්වභාවය, ආචාරශීලි බව, තැන්පත් ලීලාව, ශ්‍රද්ධාව පැහැදිලි වේ.

තවද බුදුරජාණන් වහන්සේ විසින් සමථ භාවනාවෙහි සම සතළිස් කර්මස්ථානයන් අතර අනුස්සති භාවනාවක් වශයෙන් දියුණු කළ යුතු, වැඩිය යුතු "දේවතානුස්සතිය" දේශනා කර තිබේ. දේවතානුස්සතිය වඩන අය සදෙව් ලොව උපදින අයුරු ද දක්වා තිබේ. ශ්‍රද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා ආදී සේඛබල ගුණධර්ම වර්ධනය කරන අය මරණින් මතු ඊට අනුරූපී දිව්‍ය නිකායන්හි උපත ලබන ආකාරය පෙන්වා දී තිබේ.

යමකු මෛත්‍රී භාවනාව වඩා දියුණු කරගත් මනසින්, එනම් මෛත්‍රී ධ්‍යාන සිතින්, මිය ගියහොත් බ්‍රහ්මකායික බඹලොව උපත ලද හැකි බවත්, එහි පරමායුෂ කල්පයක් බවත්, එහිදී මෛත්‍රිය දියුණු කොට සිව්සස් අවබෝධ වීමෙන් එම බඹලොව දී ම පිරිනිවන් පෑ හැකි බවත් දැක්වේ.

ගුණධර්ම රකින මිනිසා ම දෙව්ලොව දෙවියන් වන්නේ ය. එම දෙවියන් ම, ගුණධර්ම රකින මිනිසුන් මනුෂ්‍ය ලෝකයේ දී ආරක්ෂා කරන්නේ ය.

යමකු කරුණා භාවනාව දියුණු කොට කරුණා ධ්‍යාන සිතින් මිය ගියහොත් ඔහු ආභස්සර බඹලොව උපදින බවත්, එහි පරමායුෂ කල්ප දෙකක් බවත්, එහිදී කරුණාව දියුණු කොට සිව්සස් අවබෝධ වීමෙන් එම බඹලොව දී ම පිරිනිවන් පාන බවත් දැක්වේ.

යමකු මුදිතා භාවනාව දියුණු කර ගත් මුදිතා ධ්‍යාන සිතින් මියගිහහොත් ඔහු සුභකිණ්හ බඹලොව උපදින අතර, එහි පරමායුෂ කල්ප හතරකි. එහිදී මුදිතාව දියුණු කොට, සිව්සස් අවබෝධ කොට පිරිනිවීමට පත්වන අයුරු දක්වා තිබේ.

යමකු උපේක්ඛා භාවනාව දියුණු කොට උපේක්ඛා ධ්‍යාන සිතින් මියගියහොත් ඔහු වේහප්ඵල බඹලොව උපදින බවත්, එහි පරමායුෂ කල්ප පන්සියයක් බවත් දැක්වේ. උපේක්ඛාව දියුණු කොට සිව්සස් අවබෝධයෙන් එහිදීම පිරිනිවන් පාන බව දැක්වේ.

දෙව්ලොව උපත ලැබීමට ගුණධර්ම දියුණු කිරීම අත්‍යවශ්‍යම ය. දෙව්ලොව උපතක් ලබන්නට වර්ධනය කරගත යුතු ගුණධර්ම බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබේ.

ශ්‍රද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යන පංචවිධ ධර්ම මනාව වර්ධනය කිරීම, මෛත්‍රී කිරීම, කරුණාව දැක්වීම, මුදිතාව දියුණු කිරීම, පරිත්‍යාගය පුරුදු කිරීම, වැඩිහිටියන්ට සැලකීම, ගරු කිරීම, වන්දනා මාන කිරීම, වැව් පොකුණු පිරිසුදු කිරීම, මාර්ග සකස් කරදීම, මංමාවත් පිළිසකර කිරීම, ළිංපොකුණු තැනීම, පිදිය යුත්තන් පිදීම, සියලු යහපත් වූ ගුණධර්ම දියුණු කිරීම.

දෙව්ලොව අධිපති බව ලබන්නට ද දියුණු කළ යුතු ගුණධර්ම රැසක් තිබේ. ඒ අතර "සප්තව්‍රතපාද සමාදානය" ඉතා වැදගත් වේ.

දිවිහිමියෙන් මවුපියන් පෝෂණය කිරීම, දිවිහිමියෙන් කුල දෙටුවන් පිදීම, දිවිහිමියෙන් මිහිරි වචන කථා කිරීම, දිවිහිමියෙන් කේලාම් බස් නොකීම, දිවිහිමියෙන් පරිත්‍යාගශීලි වීම, දිවිහිමියෙන් සත්‍ය කථා කිරීම, දිවිහිමියෙන් ක්‍රෝධ නොකරන්නකු වීම ය.

දෙවිවරු, අල්පේශාක්‍ය දෙවිවරු. මහේශාක්‍ය දෙවිවරු යැයි කරන ලද පින්කම්වල විපාක විඳීම් වශයෙන්, සැප අඩු, සැප වැඩි දිව්‍යසම්පත් විඳිති. එසේම සම්‍යක්දෘෂ්ඨික දෙවිවරු, මිත්‍යාදෘෂ්ඨික දෙවිවරු කියා ධර්මයට කැමැති, ධර්මයට අකැමැති දෙවිවරු ද වෙති.

බොහෝ දෙවිවරු මිනිසුන්ට ප්‍රිය ය. දැහැමිව ජීවත් වන,තෙරුවන් සරණ ගිය, සිල්පද රකින, පින්කම් කරන, ධර්මයෙන් අඹුදරුවන් පෝෂණය කරන, යම් මිනිසකු ලෝකයේ කොතැනක වාසය කළත් දෙවිවරු ඔහු රකින්නේ ය. ආශිර්වාද කරන්නේ ය. නමස්කාර ද කරන්නේ ය.

ගුණධර්ම රකින මිනිසා ම දෙව්ලොව දෙවියන් වන්නේ ය. එම දෙවියන් ම, ගුණධර්ම රකින මිනිසුන් මනුෂ්‍ය ලෝකයේ දී ආරක්ෂා කරන්නේ ය.

දඩල්ල, වාලුකාරාම වෙහෙර වාසී,
**ශාස්ත්‍රපති රත්ගම සුනීත හිමි**

# ලෝක ප්‍රජාවට බුදුදහමේ සත්‍ය පසක් කරන්නට මඟ පෑදූ බහුශ්‍රැත පඬිරුවන



**ජර්මනියේ ප්‍රධාන සංඝනායක ස්විට්සර්ලන්තයේ ජිනීවා බෞද්ධ පදනමේ සහ සූරිච් බෞද්ධ විහාරස්ථානයෙහි ප්‍රධාන ආධ්‍යාත්මික උපදේශක යටියන ශ්‍රී සුදර්ශන භාවනා මධ්‍යස්ථානයේ නිර්මාතෘ සහ අධිපති**

## ආචාර්ය වල්පොල කල්‍යාණතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**අනුබුදු මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩම කළ දින පටන් නිර්මල බුදුදහම සුරැකි මහා පවුර ගරුතර සඟරුවන විය. එවන් වූ ශ්‍රී ලාංකික භික්ෂු වංශ කතාවේ ඉතිහාසය දෙස් විදෙස් පතළ ය. ලක්වැසියා දිවි හිමියෙන් සුරැකි බුදු දහම ලොව පුරා ව්‍යාප්ත කරන්නට එවක් පටන් මේ දක්වා කැප වූ යතිවරුන් බොහෝ ය.**

ජර්මනියේ ප්‍රධාන සංඝනායක ස්විට්සර්ලන්තයේ ජිනීවා බෞද්ධ පදනමේ සහ සූරිච් බෞද්ධ විහාරස්ථානයෙහි ප්‍රධාන ආධ්‍යාත්මික උපදේශක යටියන ශ්‍රී සුදර්ශන භාවනා මධ්‍යස්ථානයේ නිර්මාතෘ සහ අධිපති ආචාර්ය වල්පොල කල්‍යාණතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විදේශීය ධර්මදූත සේවාවේ නියැළී සිටින ස්වාමීන් වහන්සේ අතරින් අගයෙන් අගය කළ යුතු විශිෂ්ට ධර්මදූත සේවාවක නියැළී සිටින සුපේශල ශික්ෂාකාමී බහුශ්‍රැත පඬිරුවනක් වශයෙන් හැඳින්වීම අතිශයෝක්තියක් නොවේ.

ශ්‍රී ලාංකික බෞද්ධයන් වන අපට ලෝකයට දිය හැකි උතුම් දායාදය නිර්මල ථෙරවාදී බුදුදහමයි. බෞද්ධ දර්ශනය ඔස්සේ නවීන විද්‍යාවේ අක් මුල් සොයා යන බටහිර හා යුරෝපා ගවේශකයන් බුදු දහමේ සත්‍ය බව පසක් කරද්දී ඒ සඳහා මඟ පෑදූ පඬිරුවනක ලෙස උන්වහන්සේ අප හඳුන්වමු.

"බුදුපියාණන් වහන්සේ පෙන්වා දෙන විමුක්ති මාර්ගය, විමුක්ති දර්ශනය සාක්ෂාත් කර ගැනීමට අපට විදර්ශනා ඥාණය ඉතාම අවශ්‍ය වෙනවා. ඒ වුණත් මේ විදර්ශනා ඥාණ ලබා ගැනීම සඳහා දයාව, කරුණාව, සෙනෙහස, ළෙන්ගතුකම කියන මේ තොටිල්ලේ නැළවෙන්න අවශ්‍යයි. ඒ මඟින් අපට ඥාණ මාර්ගය අවබෝධ කරගෙන මේ සසර විමුක්තිය සාධනය කරගන්නට පුළුවන්. කරුණා, දයාව, සෙනෙහස දෙන්න ඔබට සතුට ලැබෙයි. ඔබ ඥාණවන්ත වෙන්න ඔබට විමුක්තිය ලැබෙයි යනුවෙන් උන්වහන්සේ ජාත්‍යන්තරය වෙත නිර්මල බුදුදහමේ හරය විග්‍රහකර දෙමින් විමුක්ති මාර්ගය කරා යන ගමන්මඟ පහදා දෙනු ලබයි.

1986 වර්ෂයේ දී ඉන්දියාවේ මහා බෝධි සමාගමට සම්බන්ධ වූ උන්වහන්සේ සාරානාත්හි භික්ෂු පුහුණු අභ්‍යාස විද්‍යාලය ආරම්භ කරමින් එහි විදුහල්පති ස්වාමීන් වහන්සේ වශයෙන් ධර්ම ශාස්ත්‍රීය සේවයෙහි නියැළෙමින් ලෝක බෞද්ධ ජනතාවගේ හිතසුව උදෙසා නිර්මල දහමේ හරය අවබෝධ කරදිය හැකි සඟ පරපුරක් සම්බුද්ධ ශාසනය වෙත දායාද කිරීමට අනුපමේය මෙහෙවරක් ඉටුකළහ.

වෙසක් දිනය එක්සත් ජාතීන් විසින් පිළිගැනීම නිමිති කොට ශ්‍රී ලංකා තායිලන්ත මියන්මාර් රාජ්‍ය නියෝජිතයා වශයෙන් ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයා ලෙස ද, අප්‍රිකාව, ලතින් අමෙරිකාව, හා දකුණු යුරෝපීය රටවල් 30 ක ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා සම්පූර්ණ සහයෝගය වල්පොල කල්‍යාණතිස්ස හිමිපාණන් වහන්සේ විසින් ලබා දුන්හ. යුරෝපයේ පැරැණිතම විහාරස්ථානය වන ජර්මනියේ බර්ලින් බෞද්ධ විහාරස්ථානයේ විහාරාධිපති වශයෙන් ජාතික සහ ජාත්‍යන්තරව සිදුකළ සේවය අගැයීමට ලක්කරමින් ස්‍යාමොපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර




පාර්ශ්වයේ ශ්‍රීමත් මහා නායක මාහිමිපාණන් වහන්සේ වරක් ප්‍රමුඛ ගරුතර මහා සංඝ රත්නය විසින් අභිධර්ම වාගීෂ්වරාචාර්ය ගෞරව නාමයෙන් සම්භාවනාවට පාත්‍ර කරමින් 1992 වර්ෂයේ දී ජර්මනියේ ප්‍රධාන සංඝනායක ධුරය ද උන්වහන්සේ වෙත පිරිනැමීමට ක්‍රියා කළහ.

ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ යටියන ශ්‍රී සුදර්ශනාරාම විහාරය ආරම්භ කළ උන්වහන්සේ විහාරාධිපතීන් වහන්සේ වශයෙන් වර්තමානය වන විට එය ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමට කටයුතු කර ඇත. මෙවන් උදාර ශාසනික සේවයක් ඉටුකළ

> **වෙසක් දිනය එක්සත් ජාතීන් විසින් පිළිගැනීම නිමිති කොට ශ්‍රී ලංකා තායිලන්ත මියන්මාර් රාජ්‍ය නියෝජිතයා වශයෙන් ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයා ලෙස ද, අප්‍රිකාව, ලතින් අමෙරිකාව, හා දකුණු යුරෝපීය රටවල් 30 ක ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා සම්පූර්ණ සහයෝගය වල්පොල කල්‍යාණතිස්ස හිමිපාණන් වහන්සේ විසින් ලබා දුන්හ**

ආචාර්ය වල්පොල කල්‍යාණතිස්ස නායක හිමිපාණන් වහන්සේ 1996 වර්ෂයේ සිට මේ දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා බෞද්ධ පදනම හා සූරිච් බෞද්ධ විහාරයේ ආධ්‍යාත්මික අධ්‍යක්ෂවරයා වශයෙන් ශ්‍රද්ධාවෙන් හා ප්‍රඥාවෙන් බුදුදහම ඇසුරු කරමින් එරට වෙසෙන්නන් හට නිවැරැදි ජීවිතාවබෝධයක් ලබා දෙන අතර කටාන මඩම්පැල්ල ස්විස්ලංකා ධම්ම මධ්‍යස්ථානය නමින් භාවනා මධ්‍යස්ථානයක් ද ආරම්භ කර ඇත. උතුම් පරාර්ථචර්යාව ම ගුරුකොට ගනිමින් සම්බුද්ධ ශාසනයේ චිර ජීවනයත්, දෙස් විදෙස් ජනතාවගේ අභිවෘද්ධිය පිණිසත්, උදාර සේවාවන් රැසක් සිදුකරමින් ශ්‍රී ලාංකීය නාමය ජාත්‍යන්තරයේ ඉහළින්ම ඔසවා තැබීමට ක්‍රියා කරන වල්පොල කල්‍යාණතිස්ස නායක ස්වාමීන් වහන්සේ ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ අස්ගිරි පාර්ශ්වය වෙතින් ද ගෞරව බහුමානයට පාත්‍රවූහ. ඒ කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති පූජ්‍යපාද වැලමිටියාවේ කුසලධම්ම නාහිමිපාණන් වහන්සේ විසින් එංගලන්ත තේම්ස් බෞද්ධ විහාරස්ථානයේ දී ගෞරව උපාධියක් පිරිනැමීමට කටයුතු කළ අවස්ථාය. උතුම් වූ පැවිදි ජීවිතය නිසි ලෙස පවත්වාගෙන යමින් ශාසනික ප්‍රතිපදාවන් කෙරෙහි ඇල්මකින් හා ගෞරවයකින් ක්‍රියා කරන නාහිමිපාණන් වහන්සේ වෙත ස්විට්සර්ලන්තයෙන් මහා ධර්ම ප්‍රචාරක යන ගෞරව උපාධියක්ද වෙනිසියුලා විශ්වවිද්‍යාලයේ සම්මාන ආචාර්ය උපාධියක් ද, පිරිනැමීමට කටයුතු කර ඇත.

විනයානුකූල සුපේශල ශික්ෂාකාමී පාණ්ඩිත්‍යයෙන් අනූන පඬිරුවනක් වශයෙන් ලෝක බෞද්ධ ජනතාව අතර ගෞරවාදරයට පාත්‍රවූ උන්වහන්සේ යටියන සරණතිස්ස නාහිමිපාණන් වහන්සේගේ හා දොරණාගොඩ සදානන්ද මහ පිරිවෙනේ කුරුකොහොගොඩ ජිණානන්ද නාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් විය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ උප කුලපති වූ කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමිපාණන් වහන්සේ උන්වහන්සේගේ උපාධ්‍යායන් වහන්සේ වූ අතර, ආඬිඅම්බලමේ සුගුණතිස්ස නාහිමි, යටියන විපුලතිස්ස නාහිමි යන ස්වාමීන් වහන්සේ සහාය ආචාර්යන් වහන්සේ වූහ.

1954 වර්ෂයේ දී ජන්මලාභය ලැබූ උන්වහන්සේ පූර්වෝකෘත පුණ්‍ය මහිමයට අනුව 1967 වර්ෂයේදී සම්මාසම්බුද්ධ ශාසනයේ උතුම් පැවිදි බව ලබා ආඬිඅම්බලම වේළුවනාරාම පිරිවෙන සඳලංකාව ශාස්ත්‍රෝදය පිරිවෙන, පානදුර පින්වත්ත සද්ධර්මාකර පිරිවෙන, දෙල්ගොඩ කල්‍යාණදීප පිරිවෙන යන ලංකා ශාසනම්බරය අලෝකවත් කළ පරිවේණස්ථානවලින් ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්හ. අනතුරුව කඳුබොඩ ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානයෙන් භාවනා පුහුණුව ප්‍රගුණ කළ උන්වහන්සේ ඉන්දියාවේ කල්කටා විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියත්, ආචාර්ය උපාධියත්, ප්‍රංශයේ ඩිගෝල විශ්වවිද්‍යාලයෙන් ප්‍රංශ භාෂා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත් ලබා ඇත.

**හේමමාලා රන්දුනු**

# දුෂ්කර වුව ද යුතුකම් මඟ නොහරින්න

**කැපකිරීම යනු තමාට සිදුවන පීඩාවක්, අපහසුතාවයක් හෝ පාඩුවක් ඉවසමින් කෙනකු වෙනුවෙන් යමක් උදෙසා උපකාරයක් හෝ ක්‍රියාවක් කිරීමයි.**

කැපකිරීම් දෙයාකාරයි. ඒ යහපත උදෙසා කරන කැපකිරීම සහ අයහපත උදෙසා කරන කැපකිරීමයි. යහපත් දෙයකට කැපකිරීමක් කිරීම දුෂ්කර දෙයක්. කැපකිරීම තුළ මෛත්සිත, කරුණාව, මුදිතාව ආදී සිතිවිලි ගැබ්ව තිබෙනවා.

කෙනෙක් තව අයකු උදෙසා යම් ක්‍රියාවක් සිදු කරන්නේ ද්වේෂ සිතින් හෝ වෙනත් කළ හැකි දෙයක් නොමැති නිසා නම්, එය සැබෑ කැපකිරීමක් වන්නේ නැහැ. අති ධාවනකාරී වූ වර්තමාන සමාජය තුළ යමකු වෙනුවෙන් කැපකිරීමක් කළ හැක්කේ ඉතා සීමිතවයි. එයට හේතුව නම් මෙකල ඇතැම් මිනිසුන් කෙලෙස් අධික, බොහෝ දුර්ගුණ ඇති, ප්‍රඥා රහිත සිත් ඇත්තන් වීමයි.

කෙසේ නමුත් මවුපියන් වනාහි දරුවන් කෙරෙහි මහත් වූ මෙත්, කරුණා සිත් ඇත්තෝ යි. තම දරුවා කෙරෙහි මවුපියන්ගේ සිත තුළ මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ෂා සතර බ්‍රහ්ම විහරණ තිබෙනවා. ඒ පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, බ්‍රහ්මයෝ කියන නාමය මවුපියන්ට කියන නාමයක්. පූර්ව ආචාර්යවරු යන මේ නාමයත් මවුපියන්ට කියන නමක්. දුර සිට වුවද රැගෙන එන ආහාරපානාදියෙන් උපස්ථාන ලැබිය යුතු උතුමන් යන මේ නාමය මවුපියන්ට කියන නමක්. එයට හේතුව කුමක්ද? පින්වත් මහණෙනි, දූ දරුවන්ට මවුපියන් බොහෝ උපකාරී වනවා. ඒ අය දරුවන් බිහි කරනවා. පෝෂණය කරනවා. රැක ගන්නවා. ලෝකයේ ජීවත්වන ආකාරය කියා දෙනවා. භාග්‍යවතුන් වහන්සේ දරුවන්ව මවුපියන්ගේ අගය කියා දුන්නේ උපස්ථාන කිරීමට බල කළේ මවුපියන්ගේ ගුණයත්, උපස්ථාන කිරීමෙන් දරුවාට සැලසෙන යහපතත් දන්නා නිසා ය. දක්නා නිසා ය.

දරුවකු කුස පිළිසිඳ ගත් දා පටන් මවුපියන් ඒ නොදුටු සිඟිත්තා වෙනුවෙන් බොහෝ කැප කිරීම් කරනවා. දරුවා බිහිකිරීමට තීරණය කිරීම ද ඔවුන් කරන මහා කැපකිරීමක්. අම්මා, තාත්තා ඒ අවස්ථාවේ ප්‍රතික්ෂේප කළා නම් අප කවුරුත් මෙලොව එළිය දැකීමක් සිදු වන්නේ නෑ. දරුවා කුස හොවා මව තම ගතිගුණ,සිතුම් පැතුම් කෑම බීම පවා වෙනසකට ලක් කරද්දී පියා ඒ දරුවා වෙනුවෙන් අපමණ කැපකිරීම් කරනවා.

දරුවා උපන් පසු දරුවා ලෝකයට හඳුන්වා දෙනවා. යහපත අයහපත කියා දෙනවා. ගුණගරුක දරුවකු කරන්නට වෙහෙසෙනවා. දරුවා ඉදිරියේ මවුපියන් බොහෝ සේ ඉවසීම පුරුදු කරනවා. කුඩා දරුවා එකම ප්‍රශ්නය දහ වතාවක් ඇසුවද මවුපියන් එයට ඉවසීමෙන් පිළිතුරු දෙනවා. මෙසේ අපමණ කැපකිරීම් කරන ඒ මහා බ්‍රහ්මයාට සමාන අම්මා සහ තාත්තා දරුවා ඉපදුණ දා සිට ඔහුගේ හෝ ඇයගේ අනාගතය වෙනුවෙන් සුබ සිහින දකිනවා.

සමහර විටෙක මුළු ලෝකයම එක් වී

> "දුර සිට වුවද රැගෙන එන ආහාරපානාදියෙන් උපස්ථාන ලැබිය යුතු උතුමන් යන මේ නාමය මවුපියන්ට කියන නමක්. එයට හේතුව කුමක්ද? පින්වත් මහණෙනි, දූ දරුවන්ට මවුපියන් බොහෝ උපකාරී වනවා. ඒ අය දරුවන් බිහි කරනවා. පෝෂණය කරනවා. රැක ගන්නවා. ලෝකයේ ජීවත්වන ආකාරය කියා දෙනවා."



දරුවා ප්‍රතික්ෂේප කරද්දී මවුපියෝ දෙදෙනා දරුවා අත නෑර ඔහු සමඟ සිටිනවා. එයට හොඳම උදාහරණය අංගුලිමාල මහ රහතන් වහන්සේගේ මෑණියන් වන මන්තානි බැමිණියයි.

එදා කොසොල් රජතුමා සේනාව රැස් කොට අංගුලිමාල අල්ලා ගන්නට යන බව ඇසූ ඒ අම්මා මිනීමරුවකුව සිටි තම පුතා වූ අංගුලිමාල වෙත යෑම අතිශයින් ම විස්මිත කැප කිරීමක්. අද පවා මහා අපරාධකරුවන් සිර ගත වූ විට ඔවුන්ට ඉතිරි වන්නේ අම්මා පමණයි.

එසේ අනේක දුක් දොම්නස් මහා කැපකිරීම් සිදු කොට සමාජයට පිවිසෙන දරුවා කලෙක උසස් අධ්‍යාපනය ලබා ඉහළ රැකියාවන්වල නිරත වෙද්දී වයස්ගත මවුපියන් අතහැර දමනුයේ සිත්පිත් නැති ආකාරයටයි. පිටරට රැකියාවට යන දරුවෝ නිසා මහලු මවුපියෝ තනි වෙනවා. එසේත් නැතිනම් මහමඟ හෝ මහලු නිවාසයකට යවන මහලු මවුපියෝ සිත්පිත් නැති ආකාරයට අසරණ කරනවා.

ඔවුන් තමාට කළ උපකාර ඉක්මණින් අමතක කරනවා. විවාහයෙන් පසු තමාට ලැබුණ ස්වාමියා වේවා බිරිඳ වේවා ඒ බහට අවනත වෙනවා. මහලු මඩමේ තනිවෙන අම්මා හෝ තාත්තා බලා සිටින්නේ' අද නැත්නම් හෙට දරුවෝ ඇවිත් තමන් නිවසට රැගෙන යාවි කියලයි. ඔවුන්ට මුණ ගැසෙන සියලුම දෙනාට කියන්නේ තමා බලන්නට දරුවන් එවන ලෙසයි. ඒ අම්මා තාත්තාගේ සිතින් කැකෑරෙන මග ගිනි කන්දට වගකිව යුත්තේ කවුද? ඒ දෑස පුරා ගලා යන උණු කඳුළු නවතා දැමිය හැක්කේ කාටද? එවන් දුර්ගුණ දරුවන් අතර මහාගුණ ඇති සත්පුරුෂ දරුවන් ද නැතුවා නොවේ.

කාශ්‍යප බුද්ධ ශාසනයේ ජීවත්ව හුන් ඝටීකාර උපාසක එවන් දුර්ලභ සත්පුරුෂයෙක්. අනාගාමී ඵලයට පත් වී සිටි එතුමාට උතුම් පැවිදි ජීවිතයට ඇතුල් වන්න කෙතරම් සිතේ කැමැත්තක් තිබෙන්නට ඇතිද? නමුත් ගිහි ගෙදර රැඳුනේ දෑස නො පෙනෙන මවුපියන් වෙනුවෙන්. එතුමා උතුම් කැපකිරීමක් කළ මහා පුරුෂයෙක්.

මේ ලෝකයේ සෑම දරුවෙක් ම තම මවුපියන් වෙනුවෙන් කැපකිරීම් කරනවා නම් ඒ දෙනෙත්වල කඳුළු ගලන්නේ නැහැ. භාග්‍යවතුන් වහන්සේ වදාළේ මහලු මවුපියන් පෝෂණය කරන ගමන් ඔවුන්ට සේඛබල ධර්මවල පිහිටුවන ලෙසයි. ඒ ශ්‍රද්ධා, සීල, සුත (දහම් දැනුම) ත්‍යාග, ප්‍රඥා ඒ අම්මා තාත්තාට තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නැත්නම් ඒ ගැන කරුණු කියා දී ශ්‍රද්ධාවෙහි පිහිටුවන්න කියා භාග්‍යවතුන් වහන්සේ වදාළා.

සීලය ඔවුන් පුරුදු කරන්නේ නැත්නම් සීලයේ සමාදන් කරවන ලෙස වදාළා. මවුපියන්ට දහම් දැනුම පුලුවන් අයුරු ලබා දෙන්න යැයි වදාළා. ඒ වගේම දන් දෙන්න අකැමැති මවුපියන් ත්‍යාගයට පුරුදු කරන ලෙසත්, ඔවුන්ගේ ප්‍රඥාව වැඩෙන ලෙස දහම් කතා කරන ලෙසත් දරුවන්ට අවවාද කළේ. භාග්‍යවතුන් වහන්සේ වදාළේ එසේ කරන දරුවා පමණක් අම්මා තාත්තාගෙන් ගත් ණයවලින් නිදහස් බවයි.

# සිල් රැකිය යුතු ඇයි?

රාත්‍රිය උදා වෙන්නේ ජීවත් වීමට තිබූ දහවලක් අහිමි කරගෙන. උදෑසන උදාවෙන්නේ ජීවත් වීමට තිබූ රාත්‍රියක් අහිමි කරගෙන. බලන්න, රෑ දහවල ගතවෙනවා. අවුරුද්දකට දින 365ක් තිබෙනවා. මේ දින සියල්ලම සමහරවිට අපි නො වටිනා දේවලට යටකර දමනවා විය හැකියි. එක එක දෙයට අවධානය දී කාලය අහිමි කර දමනවා. මුළු අවුරුද්දට ම පසළොස්වක පෝය දින 12 යි උදා වෙන්නේ. යම් පුද්ගලයෙක් වසරක් පුරා කරන සියලුම කටයුතු පෝ දිනට අතහැරලා එදිනට උපෝසථ අෂ්ඨාංග සීලය සමාදන්වීමට වෙන් කළා කියල හිතමු. ඔහු මුළු වසරට ම උපෝසථ සීලය සමාදානයට වෙන් කරන්නේ දින 12ක් පමණයි. දින 365කින් දින 12 වගේ අඩු කාලයක් තමා උපෝසථ අෂ්ඨාංගයට වෙන් කරන්නේ. බොහෝ දෙනෙක් ඒ දින 12 ම සම්පූර්ණ වන තුරු සිල් සමාදන් වෙන්නෙත් නැහැ. එනිසා හිතන්න, අපේ ජීවිතයට වටිනා සීලය කෙ තරම් වේගයෙන් අපට මඟහැරී යනවා ද?

ජීවිතයේ නොයෙක් කටයුතු අතරේ අපි උනන්දු වෙනවා නම් උපෝසථ සීලය රකින කෙනෙක් වෙන්න ඒක කොතරම් සුන්දර ද? මේ ජීවිතයේ අපිට මේ මිනිස් ලෝකයේ ඉතාම කෙටි කාලය යි ජීවත්වෙන්න අවස්ථාව තිබෙන්නේ. එනිසා මාසයකට එක දිනක් උදාවෙන පෝ දින අමතර වැඩවලට යොමු කරන්න එපා. මේ පෝ දින සිල් සමාදන් නොවී ඊළඟ පෝයට සිල් සමාදන් වෙන්න අපට කරන්න පුළුවන් දෙයක් වෙන්නත් පුළුවන්. බැරිවෙන්නත් පුළුවන්. බුදුරජාණන් වහන්සේ වදාළා, අද අදම මේ මොහොතේ ම යහපතේ ම යෙදෙන්න කියලා. මරණය කියන දේ ඊළඟ මොහොතේ පැමිණිය නොහැකියි කියලා කාටනම් කිව හැකි ද? ඇයි අප සිල්වත් විය යුත්තේ.? බුදුරජාණන් වහන්සේ වදාළා මහණෙනි, සීලය තිබෙන්නේ පිරිසුදු ජීවිතයක් උදෙසායි. පසුතැවෙන දේ නො කරන්නයි. එනිසා සීලය ඔබත් මේ මොහොතේම පටන් පුරුදු කරන්න යනුවෙන්උන්වහන්සේ වදාළා.

නයනා නිල්මිණී

# කෙනකුගෙන් කෙනකුට ඇයි මෙතරම් වෙනසක්

**තරගකාරී වත්මන් සමාජය දෙස බැලීමේ දී මිනිසුන් අතර නොයෙක් ආකාරයේ උස් මහත්කම්, වෙනස්කම් දක්නට ලැබෙන බව අපට පෙනෙනවා. එසේම සමහර අය බොහෝ කල් ජීවත් වෙනවා. සමහර අය අඩු වයසින් මිය යනවා.**

සමහර අය බොහොම නිරෝගීව සිටිනවා. සමහර අය රූප සොබාවෙන් ඉතාමත් ලස්සනයි. සමහර අය උසස් කුලවල මහේශාක්‍යව උපදිනවා. සමහර අය පහත් කුලවල අන්ත දුක්ඛිතව උපදිනවා. සමහර අය ප්‍රඥාවන්තයි. තවත් අය දුෂ්ප්‍රාඥයි. මේ ආකාරයට මිනිසුන් තුළ විවිධත්වයක් ඇතිවන්නේ ඇයි? යන ප්‍රශ්නය ඔබට ද නිරන්තර සිතෙන්නට ඇති.

මෙවැනි ප්‍රශ්න රාශියක්, බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන කාලයේ දවසක් තෝදෙය්‍ය කියන බ්‍රාහ්මණයාගේ පුතා වන සුභ නමැති තරුණයාට ඇති වුණා. බුදුරජාණන් වහන්සේ මුණගැහිලා සුහද පිළිසඳරකින් පසුව බුදුරජාණන් වහන්සේගෙන් "පින්වත් ගෞතමයන් වහන්ස, මේ ලෝකයේ ජීවත්වන මිනිසුන් අතර නොයෙක් උස් – පහත්කම් වෙනස්කම් දකින්න ලැබෙනවා. සමහරු බොහෝ කල් ජීවත් වෙනවා. සමහරු අඩු වයසින් මැරෙනවා. යනාදී වශයෙන් උන්වහන්සේගෙන් අසන අතර 'මෙවැනි වෙනස්කම් ඇතිවන්නට හේතු වන කරුණු මොනවාද?" කියා අසනවා. ඒත් සුභ තරුණයා තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයෙක් බවට පත්වෙලා හිටියේ නැහැ.

බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා "පින්වත් තරුණය, සියලු සත්ත්වයෝ තමාගේ දේ කරගෙන සිටින්නේ කර්මයයි. කර්මය, උප්පත්ති ස්ථානය කරගෙන, කර්මය ම දායාද කරගෙනයි ඉන්නේ. කර්මය තමයි හැමෝගේම නෑදෑයා. කර්මය පිළිසරණ කරගෙනයි මේ සියලු දෙනා ජීවත් වෙන්නේ. අන්න ඒ කර්මය විසින් තමයි මේ සත්ත්වයින් අතර උස් පහත්කම් ඇති කරලා තියෙන්නේ.

සුභ තරුණයාට මෙය එතරම් තෙරුම් ගියේ නැහැ. සුභ තරුණයා කියනවා" අනේ පින්වත් ගෞතමයන් වහන්ස, කෙටියෙන් කියන ලද එම කාරණය, මට හරියට තේරුණේ නැහැ. ඒ නිසා විස්තර වශයෙන් කියලා දෙනවා නම් මම හරි කැමතියි."

එවිට බුදුරජාණන් වහන්සේ "එසේ නම් පින්වත් සුභ අහන්න, මම ඒ කාරණය විස්තර වශයෙන් කියලා දෙන්නම්" කියලා සුභ තරුණයා ඇතුළු සැම දෙනාටම මේ දේශනාව වදාළා.

පින්වතුනි, මේ ලෝකයේ, ඇතැම් මිනිස්සු ඉන්නවා රුදුරු අය, අත්වල ලේ ගාගෙන නොයෙක් ආයුධ ඇතිව සතුන් මරනවා. සතුන් ගැන ඔවුන්ට අනුකම්පාවක් නැහැ. ඔය විදියට ජීවත් වෙන මිනිස්සු ඒ කර්මය හේතුවෙන් මරණින් මත්තේ දුක් සහිත වූ අපායේ උපදිනවා. බැරි වෙලාවත් මිනිස් ලෝකයේ ඉපදුණොත් අඩු වයසින් මරණයට පත් වෙනවා.

මේ ලෝකයේ මිනිස්සු ඉන්නවා සතුන් මැරීමෙන් වැළකිලා. අවි– ආයුධ අත ඇරලා සියලු සතුන් කෙරේ අනුකම්පාවෙන් ඉන්න. සතුන් මරන්න ලජ්ජයි බයයි. ඔය විදියට ජීවත් වෙලා ඒ කර්මය හේතුවෙන් මරණින් මතු සැප සම්පත් සහිතව දෙව්ලොව උපදිනවා. යම්කිසි හේතුවකින් මිනිස් ලෝකයේ ඉපදුණොත් දීර්ඝායුෂ ලබනවා.

මේ ලෝකයේ මිනිස්සු ඉන්නවා අත – පයින්, ගල් – මුගුරුවලින් ආදියෙන් සතුන්ට හිංසා පීඩා කිරීමෙන් ජීවත් වෙන අය. ඒ විදියට ඔවුන් රැස්කරන කර්ම හේතුවෙන් මරණින් මතු දුක් සහිත වූ අපායේ උපදිනවා. බැරි වෙලාවත් මිනිස් ලෝකයේ ඉපදුණොත් නිතරම නොයෙක් ලෙඩ රෝගවලින් පීඩා විඳිමින් ජීවත් වෙන්නට සිදු වෙනවා. කොයි මොහොතේ බැලුවත් මොකක් හරි අසනීපයකින් පීඩා විඳිනවා.

මේ ලෝකයේ ඇතැම් අය ඉන්නවා අත පයින් හෝ පොලු මුගුරුවලින් ආයුධ ආදියෙන් හෝ සතුන්ට හිංසා පීඩා කිරීමෙන් වැළකී ජීවත් වෙනවා. එසේ රැස් කරන කර්ම හේතුවෙන් මරණින් මත්තේ සැප විපාක සහිත වූ සුගතිය නම් වූ දිව්‍ය ලෝකයේ උපදිනවා. මිනිස් ලෝකයේ ඉපදුණොත් නිතරම ඉතාම නිරෝගී ජීවිතයක් ලබනවා.

මේ ලෝකයේ ඇතැම් අය නිතරම ඉන්නේ තරහ ගිහින්. ඉතාම පොඩි දේකටත් ගොඩාක් තරහ ගන්න බලාගෙන ඉන්නේ. නිතරම වෛරයෙන්, තරහින්, තදගතියෙන් පිරිලා ඉන්නේ. සිත් තැවුලෙන් ජීවත් වෙනවා.

ඔවුන් ඒ විදියට රැස්කරන කර්ම හේතුවෙන් මරණින් මත්තේ දුක් සහිත වූ අපායේ උපදිනවා. බැරිවෙලාවත් මිනිස් ලොව ඉපදුණොත් දුර්වර්ණ වූ කැත රූපයක් තමයි ලබන්නේ.

මේ ලොව සමහර මිනිස්සු ඉන්නවා වෛරයෙන් පිරිලා නෑ, සුළු දේටත්, ලොකු දේටත් තරහ ගන්නේ නැහැ. නොසතුටු බවක් දක්වන්නෙත් නැහැ. අන් අයගේ වැරැදිවලට සමාව දෙමින් සියලු දෙනා කෙරෙහි මෙත් සිතින් වාසය කරනවා. එසේ රැස් කරන කර්ම හේතුවෙන් මරණින් මත්තේ සැප විපාක සහිත වූ සුගතියේ උපදිනවා. බැරිවෙලාවත් මිනිස් ලෝකේ ඉපදුණොත් ඉතා ලස්සන, සිත් ඇදගන්නා සුළු රූපයක් ලබනවා.

මේ ලෝකයේ ඉන්න ඇතැම් මිනිස්සු අනික් අයගේ යහපතට ඊර්ෂ්‍යා කරනවා. විශේෂයෙන්ම තමන් අකැමැති අය හොඳ ජීවිත ගත කරනවාට ඒ අය කැමැති නැහැ. එමෙන්ම ඔවුන් තමන්ට නැති ගෞරව, ලාභ සත්කාර, වැඳුම්, පිදුම්, කීර්ති – ප්‍රශංසා ලැබීම ගැන නොසතුටෙන් ඉන්නවා. ඒ ආකාරයට රැස්කරන කර්ම හේතුවෙන් මරණින් මත්තේ දුක් – විපාක සහිත වූ අපායේ උපදිනවා. බැරි වෙලාවත් මිනිස් ලෝකේ ඉපදුණොත් හරියට කෑමක් – බීමක් නැතිව දුගී දුප්පත් පවුල්වල උපත ලබලා ජීවිතය ගෙවන්න සිද්ධ වෙනවා.

මේ ලෝකේ ඉන්න සමහර මිනිස්සු දන් දෙන්න සැදී පැහැදී ඉන්නවා. ලෝභකමින් තොරව තියෙන පොඩි දෙයක් හරි සිතේ පැහැදීමෙන් දෙනවා. තමන්ගේ දේ අනුන්ට දීමෙන් සතුටු වෙනවා. එසේ රැස් කරන කර්ම හේතු කොටගෙන මරණින් මතු සුගතියේ උපදිනවා. මනුස්ස ලෝකයේ ඉපදුණොත් යාන වාහන, සේවකයන්, සුව – පහසු නිවාස, මිල – මුදල් බොහෝ තිබෙන පොහොසත් පවුල්වල උපත ලබලා ජීවත් වෙනවා.

මේ ලෝකයේ ඇතැම් මිනිස්සු ගරු කළ යුත්තන්ට ගරු කරන්නේ නැහැ. සිතට අරන් දැඩි මාන්නයෙන් සිටිනවා. පිදිය යුත්තන් පුදන්නේ නැහැ. ඒ විදියට රැස්කරන කර්ම හේතුවෙන් මරණින් මත්තේ දුක් සහිත වූ අපායේ උපදිනවා. බැරිවෙලාවත් මනුස්ස ලෝකේ ඉපදුණොත් හීන කුලයේ උපත ලබනවා.

මේ ලෝකයේ සමහර මිනිස්සු ඉන්නවා ගරු කළ යුත්තන්ට ගරු කරනවා. සත්කාර කරනවා. නිහතමානීව ඉන්නවා. පිදිය යුත්තන් පුදනවා. එසේ රැස් කරන කර්ම හේතුවෙන් මරණින් මත්තේ ඔවුන් සුගතියේ උපදිනවා. බැරි වෙලාවත් මනුස්සස ලෝකේ ඉපදුණොත් උසස් කුලවල උපත ලබනවා.

මේ ලෝකයේ ඉන්න සමහර මිනිස්සු හිතාගෙන ඉන්නේ දැනගත යුතු දේවල් සේරම මම දන්නවා. තවත් දැනගන්න දෙයක් නැහැ කියලයි. ආර්ය මහා සංඝ රත්නය මුණගැහිලා කුසල් – අකුසල් පිළිබඳ,හොඳ, නරක ගැන යහපත – අයහපත ගැන, දන්නා – නොදන්නා දේ ගැන දැනගන්න උනන්දු වෙන්නේ නැහැ. තමන් නොදන්නා බවවත් දන්නේ නැහැ. ඔය විදියට රැස් කරන කර්මය මරණින් මත්තේ විපාක ඇති අපායේ උපදින්න හේතුවෙනවා. බැරි වෙලාවත් මිනිස් ලෝකයේ ඉපදුණොත් කියන දේ නොතේරෙන දුෂ්ප්‍රාඥ මෝඩ කෙනෙක් වෙනවා.

මේ ලෝකයේ සමහර මිනිස්සු ඉන්නවා. ඒ අය පින්වත් ස්වාමීන් වහන්සේලා මුණගැහිලා තමා නොදන්නා දේ අසා දැනගෙන තමාගේ යහපත පිණිස පවතින දේ මෙන් ම තමාගේ අයහපත පිණිස පවතින් දේත්, කුසල් මෙන්ම අකුසල් ගැනත්, තමා නොදන්නා දේ ගැනත් අසා දැනගෙන ඒ අනුව කටයුතු කරනවා. ඒ ආකාරයෙන් රැස්කරන කර්ම හේතුවෙන් මරණින් මත්තේ ඔවුන් සැප විපාක දෙන සුගතියේ උපදිනවා.

බැරි වෙලාවත් මිනිස් ලොව ඉපදුණොත් වහා වැටහෙන නුවණ ඇති අදාළ දේ සුදුසු වෙලාවේ දී තේරුම් යන ප්‍රඥාවන්තයෙක් ලෙස උපදිනවා.

පින්වත් සුභ, ඔය ආකාරයෙන් මම දේශනා කළේ සියලු සත්වයෝ තමාගේ දේ කරගෙන සිටින්නේ කර්මයයි. කර්මය උප්පත්ති ස්ථානය කරගෙනයි දායාදය කරගෙනයි ඉන්නේ. කර්මය තමා හැමෙගේම නෑදෑයා. කර්මය පිළිසරණ කරගෙන මේ සියලු දෙනා ජීවත් වෙන්නේ. අන්න ඒ කර්මය විසින් තමයි මේ සත්ත්වයින් අතර උස් පහත් වූ විවිධ වෙනස්කම් ඇති කරන්නේ.

මෙය අසා සිටි සුභ මානවක භාග්‍යවතුන් වහන්ස, ඉතා පුදුමයි. හරිම ආශ්චර්යයි.

යටිකුරුව තිබුණු දෙයක් උඩුකුරු කළා වගේ, වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගේ, අතරමං වෙලා හිටපු කෙනකුට පාර පෙන්නුවා වගේ, කළුවරේ සිටින අය රූප දකිත්වා කියලා තෙල් පහනක් පත්තු කළා වගේ, මම අද පටන් බුදුරජාණන් වහන්සේත්, ශ්‍රී සද්ධර්මයත්, ආර්ය මහා සංඝ රත්නයත් දිවි හිමියෙන් සරණ යනවා'යි තේරුවන් සරණ ගියා.



අයන්ති විතාන

# නමදිමු සිරිපා



බුදු හිමි පහස ලද සිරි සමනොළ කන්දයි
සුමන සමන් දෙවියන් වැඩ සිටි කන්දයි
ලෝ වැසි දනන් සැමට සෙත දෙන පින්බිමයි
සිරිපා වන්දනා ඇරඹුම නෙත් සිත් පිනවයි

දුක්ගිනි නිවා වඩවයි නිති මෙත් සිසිල
හදවත් සනසවයි කරුණා ගුණ මහිම
මෙත් මුදිතා ගුණයෙන් සිත් ඔද තෙද වඩන
කරුණා කරමු සිරිපා දුක් ගිනි නිවන

ලෝ සත වෙතට මෙත් කරුණා ගුණ විහිදු
අම රස බෙදා දී දන හදවත් සැනසූ
සෝ ගිනිදැල් නිවා ලොව්තුරු මඟ සැදූ
දොහොත් නඟමු තුම්මිනි සිරිපා සාධු

**ඇල්.ජේ. ආනන්දශීලි පෙරේරා**

# අභිනික්මන

මව් තුරුල්ලේ උණුසුමේ
සිහනයක දැවටී නිදන
බලා පුතු මුව
සිහින් හඬින් පියමං කොට
සසර ඉම සොයාවින්
නිවන් ගිරි හිස රැඳී
සරාගී හද නිවා
විරාගී බව ලොවට දුන්
නිදුකාණනේ
ඔබ වහන්සේ උදාර ය
පින්බර ය

**මාස්පොත ධම්මජෝති හිමි**
මීරිගම

# සිත රැක ගනිමු

සහනය සතුට සැනසුම ලබා ගනු මැන
පුහුණුව මැදි මී මාවත වෙයි දකිනු මැන
රහසක් නොමැත හිමි දහමෙහි කිසිම තැන
පහසක් ලබනු බුදු හිමි දෙසූ දහම දැන

අහස පොළොව ගැටලන්නට යන්ට එපා
තමා හිසට තම අතමය සෙවණ දෙනා
පමා වුණොත් ලැබූ මනු බව අපතෙ තමා
දමා මැදි මගෙහි සිත රැක ගන්න තමා

**විමලසේන හෙට්ටිආරච්චි**






# අවසන් බැල්ම

තුරුණු වියේ
දඟකාර විසේටම
මුගුරකින්
නොනැවතී එක දිගට තළමින්
මැරූ උරගයාගේ දෑස් තුළ
අවසන් මොහොතේ තිබූ
අවසාන දිවි යදින
දුක් මුසු "ආයාචනා බැල්ම"

ජීවිතේ අවසාන භාගයේ
මහලු වියේ සයනයේ
පසුවෙනා අද දිනේ
මසිත තුළ නොනැවතී
දරණ ගසමින් පෙනය පුප්පා
දෂ්ට කරනා හැටි
උරග විස සිත පුරා ගත පුරා
මොහොතින් මොහොත පැතිරෙමින්
මා පෙළනා හැටි

**කේ. ඩබ්ලිව්. සිරිසේන**
මාලබේ

# මව් සෙනෙහස



මා වෙනුවෙන් ඉපදුණු දරු සෙනෙහසට
ගතේ රුහිරු හැරුණේ රන් කිරිවලට
සම නොම වේ මේ ලොව අන් කිසිවකට
ආදර මවුනි ඔබ මට දුන් සෙනෙහසට

පැමිණි දා පටන් මා ඔබේ කුස තුළට
ඉවත දා සිතින් අන් සැප මුල්ලකට
බිහිවූ දා කුසින් ඔබේ පුතු මේ ලොවට
සතුටින් සිනා පෑවේ මා තුරුලු කොට

**ඒ.එම්.අබේසිංහබණ්ඩා**
මහනුවර

# දුරුතු පොහොය

සම්බුදු බව ලබා නව මසකට පස්සේ
තුන් බෑ ජටිලයන් දමනය කර සිත් සේ
යක්සෙන් දමනයට මහියංගණයට වැඩියේ
සීතල දුරුතු පෝදාකයි මුල් මාසේ

සුමන සමන් දෙවියන් පෙරමුණ ගත්තේ
සත්රියනක් උසට කළ දාගැබ ඇත්තේ
කේශධාතු එහි නිදහන් කර ඇත්තේ
මියුගුණ මහ සෑය ඉදිවිය දුරුත්තේ

සමන් දෙවිඳුගෙ ඇරයුම පිළිගත්තේ
සම්බුදු පාද පිහිටෙව් සමනළ මත්තේ
නරයන් රකින බව සහතික කර ගත්තේ
සිරිපා වැඳුම අරඹයි මේ දුරුත්තේ

**පී.ඒ. ලිලියන් අතුකෝරළ**

# නමදිමු තිලොවග සමිඳු

පරවුණ මල් මිටෙන් අනියත බවක් කියා
දැල් වුණ පහන් ආලෝකය නිවී ගියා
සංවේදනා අප හදවත් පතුලෙ තියා
නිවනෙහි දොරටු නොවසමු නෙත කඳුළු තියා

අටලෝ දහම හැමටම පොදු බවක් කියා
සුසිනිඳු රුවැති මල් පරවී සැලී ගියා
සුපිපුණු සුවඳ මල් බුදු පාමුලේ තියා
නමදිමු පුදමු අප සම්බුදු තිලොව පියා

**චන්ද්‍රලතා ලියනගේ**

# උත්පලවන්නා තෙරණින් වහන්සේ



පෙර බව පැතූ විලස ගත නිල් පැහැ ගන්නා
සිරිබර සැවැත්පුරයට සිරිකත ගෙන්නා
දන හද පුබුදු කොට කරුණා ගුණ පෙන්නා
රූමත් කුමරියකි ඈ උත්පල වන්නා

අරුණලු සමඟ පිබිදුනු සේ කුසුම් කෙමී
දැහැනින් මිදී නිමලවූ දම් රසින් තෙමී
දෙව්රම් වෙහෙර ගොස් බැතිබර සිතින් නැමී
නැමදූ නිරන්තර සිරිපා ගොයුම් හිමී

ගෙවමින් සසර කතරෙහි ආ ගමන නොබා
නිමකොට අරි අටගි මඟ වෙත දෙපිය තබා
ඉදු බල පෙන්වමින් අරහත් ඵලය ලබා
ඈ සැනසුණා විඳිමින් අම නිවන පබා

"පදුමුත්තර සුගත හිමිගෙන් වරම ලදු
ඒ පිනෙන් මෙකප ලැබ ගති මහ බලය ඉදු
දෙසමින් පෙර පුවත තිලොවග සමිඳු බුදු
මෙහෙණින් අතර ඉදු අග සවි පදවි පිදු

**දඹගල්ලේ කේ.බී. රත්නායක**

# සෙනෙහස

දහඩිය හෙළා මහ පොළොවත් සමඟ ගැටී
නුඹේ කුස පුරවන්න ඔහු දුක් වින්ද හැටී
සිහිවෙනවා නම් දරුවනි බොහොම වටී
පියවරුනගේ සෙනෙහස ලෝකයක් වටී

මව හා එකට අත්වැල් බැඳ යන ගමනේ
හිරුමෙන් ශක්තියෙන් දිරි දුන් පියවරුනේ
අප රැකගන්න දුක් විඳිමින් දිවි ගමනේ
අත්වැල නුඹයි පියතුමනි හද විමනේ

**සුමනාවතී අත්තනායක**
කන්දේගම දම්මින්න

# සදහම් සුව

තිලෝගුරු අපෙ බුදු පියාණන් පා තැබූ දින හෙළ බිමේ
යක්ඛයන්, නාගයන්, දමනය වුණේ දහමට මේ බිමේ
තවත් කල් පන්දහස් වසරක් රැකෙන්නට සිරිලක් බිමේ
දෙසුව සුවහස් දනන් හට මෙත් වඩාලා දම් සුවේ

**ගාමිණී ජයලත් තල්දෙන**

## බුදුසරණ පහන් සිතක කවි

BCC

සම්පූර්ණ නම :- ..........................................
ලිපිනය :- ..........................................
දුරකථන අංකය :- ..........................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.